# වාර්ෂික වාර්තාව - 2010

## ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය



ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
පස්සර පාර
බදුල්ල

# විශ්වවිද්‍යාලයේ කුලපති සහ නිලධාරීහු – 2010

**කුලපති:**
රාජකීය පණ්ඩිත පූජ්‍ය ආචාර්ය අළුත්වැව සෝරත හිමි, බී.ඒ. , පී.එච්.ඩී. (ශ්‍රී ජයවර්ධනපුර)

**නිලධාරීහු:-**

| | |
|---|---|
| **උපකුලපති:** | චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා බී.එස්.සී. (ගණිත) (පේරාදෙණිය), ගණිතය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පේරාදෙණිය) |
| **පීඨාධිපතිවරු:** | ආචාර්ය ජී. චන්ද්‍රසේන, බී.එස්.සී කෘෂි (ශ්‍රී ලංකා), එම්.එස්. සී (කැලණිය), එම්පිල් (පේරාදෙණිය), පී.එච්.ඩී (එක්සත් රාජධානිය), / සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති |
| | ආචාර්ය එස්.සී. ජයමාන්න බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), පී.එච්.ඩී (ස්කොට්ලන්තය), මඩ කුකුළු මත්ස්‍යාගාරවල ජෛව පරිසරවේදය පිළිබඳ එම්පිල් (ශ්‍රී ජයවර්ධනපුර) / විද්‍යා සහ තාක්ෂණවේද පීඨයේ වැඩබලන පීඨාධිපති |
| | ආචාර්ය එස්.ජී. සිවගුරුනාදන් බී.ඒ (මයිසූර්), එම්.ඒ (යාපනය), පී.එච්.ඩී (මයිසූර්) / කළමනාකරණ පීඨයේ වැඩබලන පීඨාධිපති |
| **ලේඛකාධිකාරී:** | නිල්මිණී දියබෙදනගේ මහත්මිය බි.කොම් (කොළඹ), රාජ්‍ය පාලනය පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව (කොළඹ), එම්.පි.ඒ. (ශ්‍රී ජයවර්ධනපුර)<br>(සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටී) |
| | ආර්.වී.එස්.පී. රාජපක්ෂ මහතා බි.බි.ඒ. (රුහුණ)<br>(වැඩබලන ලේඛකාධිකාරී) |
| **පුස්තකාලයාධිපති:** | තනතුරු පුරප්පාඩු වී ඇත. |
| **මූල්‍යාධිකාරී** | ගාමිණී ලියනගේ මහතා බී.එස්.සී (ශ්‍රී ජයවර්ධනපුර), පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කළමනාකරණ) (රජරට)<br>(වැඩබලන මූල්‍යාධිකාරී) |

# පාලක සභාව – 2010

| | |
|---|---|
| චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා | උප කුලපති |

**පීඨාධිපතිවරු**

| | |
|---|---|
| ආචාර්ය ජී. චන්ද්‍රසේන | සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති |
| ආචාර්ය එස්.සී. ජයමාන්න | විද්‍යා සහ තාක්ෂණවේද පීඨයේ වැඩබලන පීඨාධිපති |
| ආචාර්ය එස්.ජී. සිවගුරුනාදන් | කළමනාකරණ පීඨයේ වැඩබලන පීඨාධිපති |

**සනාතන සභා නියෝජිතවරු**

ආචාර්ය ඒ.එම්.ඒ.එන්.බී.අත්තනායක

**විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයෝ**

| | |
|---|---|
| රෝහණ කීර්ති දිසානායක මහතා | අතිරේක දිස්ත්‍රික් ලේකම්, බදුල්ල. |
| ජී. සේනාධිරාජා මහතා | නීතිඥ |
| මාෂල් පෙරේරා මහතා | ජනාධිපති නීතිඥ, නීතිඥ |
| මහින්ද කටුගහ මහතා | නීතිඥ |
| එස්. එස්. දිඹුලාන මහතා | නීතිඥ (2010.07.07 දින සිට) |
| ඩී.ඒ.ඩී.ඊ. එස්. වික්‍රමනායක මහතා | සභාපති, පැල්වත්ත සීනී සමාගම (2010.07.07 දින සිට) |
| ආචාර්ය එන්. එස්. නවගීගන රාජපක්ෂ මහතා | ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (2010.07.07 දින සිට) |
| ඩී. ඊශ්වරන් මහතා | සභාපති, ජාතික වාණිජ මණ්ඩලය |
| ඉසුරු තිලකවර්ධන මහතා | අධ්‍යක්ෂ, මානව සම්පත්, හේමාස් හෝල්ඩින්ස් සමාගම (2010.04.23 දින දක්වා) |
| නිල්මිණි දියබෙදනගේ මහත්මිය | ලේඛකාධිකාරී/ පාලක සභාවේ ලේකම් (සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටි) |
| ආර්.වී.එස්.පී. රාජපක්ෂ මහතා | වැඩබලන ලේඛකාධිකාරී/ පාලක සභාවේ ලේකම් |

# සනාතන සභාව – 2010

| | |
|---|---|
| චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා | උප කුලපති |

**පීඨාධිපතිවරු:-**

| | |
|---|---|
| ආචාර්ය ජී. චන්ද්‍රසේන | සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති |
| ආචාර්ය එස්.සී. ජයමාන්න | විද්‍යා සහ තාක්ෂණවේද පීඨයේ වැඩබලන පීඨාධිපති |
| ආචාර්ය එස්.ජී. සිවගුරුනාදන් | කළමනාකරණ පීඨයේ වැඩබලන පීඨාධිපති |


**අධ්‍යයනාංශ ප්‍රධානීහු**

| | |
|---|---|
| ආචාර්ය එස්.සී. ජයමාන්න | සත්ව විද්‍යා අධ්‍යයනාංශය |
| ආර්.ඒ.පී.අයි.එස්. ධර්මදාස මහතා | අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශය |
| ආචාර්ය ඒ.එම්.ඒ.එන්.බී.අත්තනායක මහතා | පරිගණක විද්‍යා සහ තාක්ෂණවේද අධ්‍යයනාංශය හා විද්‍යා සහ තාක්ෂණවේද අධ්‍යයනාංශය (වැඩබලන) |
| පී. ඉමාලි එන්. ප්‍රනාන්දු මහත්මිය | කළමනාකරණ විද්‍යා අධ්‍යයනාංශය (2010.06.14 දින දක්වා) |
| කේ.ඩබ්. එස්.ඒන්. කුමාරි | කළමනාකරණ විද්‍යා අධ්‍යයනාංශය (2010.09.07 දින සිට) |

**පීඨ නියෝජිතවරු**

| | |
|---|---|
| ජනක සියඹලාපිටිය මහතා | කළමනාකරණ පීඨය |
| එම්.රැබවදනන් මහතා | කළමනාකරණ පීඨය |
| ආචාර්ය කේ.බී. විජේසේකර | විද්‍යා සහ තාක්ෂණවේද පීඨය |
| ඩී. කේ.ඩී.ඩී. ජයසේන මහතා | සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය |
| පී.ඊ. කාලියදාස මහත්මිය | සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය |
| නිල්මිණි දියබෙදනගේ මහත්මිය | ලේඛකාධිකාරී/ සනාතන සභාවේ ලේකම් (සජ්ත වාර්ෂික නිවාඩු ලබා සිටි) |
| ආර්.වී.එස්.පී. රාජපක්ෂ මහතා | වැඩබලන ලේඛකාධිකාරී/ සනාතන සභාවේ ලේකම් |

# සංවිධාන ව්‍යුහය ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය - 2010



# අන්තර්ගතය


විශ්ව විද්‍යාලයේ කුලපති සහ නිලධාරීහු - 2010 ...................................... i

පාලක සභාව - 2010 ...................................... ii

සනාතන සභාව - 2010 ...................................... iii

සංවිධාන ව්‍යුහය ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය - 2010 ...................................... iv

අන්තර්ගතය ...................................... v

1. අපගේ දැක්ම ...................................... 01

2. අපගේ මෙහෙවර ...................................... 01

3. උපකුලපතිතුමාගේ සමාලෝචනය ...................................... 02

4. සම්පත් සහ ශිෂ්‍ය විස්තර ...................................... 03

4.1 අධ්‍යයන පාඨමාලා සහ භාර කාර්යමණ්ඩලය ...................................... 03

4.2 ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා මූල්‍ය ආධාර ...................................... 04

4.3 නේවාසිකාගාර පහසුකම් ...................................... 04

4.4 පුස්තකාලය ...................................... 05

4.5 යටිතල පහසුකම් සංවර්ධනය ...................................... 07

4.6 ශිෂ්‍ය උපදේශනඥයෝ ...................................... 07

4.7 සෞඛ්‍ය පහසුකම් ...................................... 08

5. දේශීය ශිෂ්‍ය විස්තර ...................................... 09

6. විදේශ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ...................................... 11

7. අධ්‍යයන කාර්යමණ්ඩලය ...................................... 12

7.1 2010 වර්ෂයේදී අධ්‍යයන ප්‍රභේදයේ සමස්ත මානව සම්පත ...................................... 12

7.2 සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය ...................................... 13

7.3 කළමනාකරණ පීඨය ...................................... 15

7.4 විද්‍යා සහ තාක්ෂණවේද පීඨය ...................................... 16

8. අනධ්‍යයන කාර්යමණ්ඩලය ...................................... 20

9. පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන ...................................... 23

9.1 පර්යේෂණ ...................................... 23

9.1.1 සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය ...................................... 23

9.1.2 විද්‍යා සහ තාක්ෂණවේද පීඨය .................................................... **30**

9.1.3 කළමනාකරණ පීඨය .................................................... **30**

9.2 නව නිපැයුම් .................................................... **32**

10. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර .................................................... **34**

10.1 පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන .................................................... **34**

10.2 උපාධි වැඩසටහන් .................................................... **34**

10.3 සහතික පත්‍ර වැඩසටහන් .................................................... **35**

10.4 ප්‍රජා සේවා සම්පාදක වැඩසටහන් .................................................... **35**

10.5 කාර්යමණ්ඩල සංවර්ධනය, සම්මන්ත්‍රණ සහ වැඩමුළු.................................................... **37**

11. ලැබුණු ප්‍රදානයන්හි විස්තර .................................................... **39**

12. ආරම්භ කරන ලද නව පාඨමාලා .................................................... **39**

13. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර .................................................... **39**

14. මූලධන වියදම පිළිබඳ විස්තර.................................................... **40**

15. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය / විදේශීය අරමුදල් සම්පාදිත)........... **40**

16. ව්‍යාපාති වියදම පිළිබඳ විස්තර (දේශීය / විදේශීය අරමුදල් සම්පාදිත).. **41**

17. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර .................................................... **41**

18. මූල්‍ය ප්‍රගතියේ විස්තර (පොදු ආදායම) .................................................... **42**

19. **2010** වර්ෂයේදී ලැබුණු යටිතල පහසුකම් පිළිබඳ විස්තර.................... **42**

20. **2010** වර්ෂයේදී ලැබුණු යටිතල පහසුකම් පිළිබඳ විස්තර.................... **42**

21. විගණකාධිපති වාර්තාව .................................................... **43**

22. විගණකාධිපතිතුමාගේ වාර්තාවේ මතු කර ඇති ප්‍රශ්නවලට පිළිතුරු..... **51**

## 1. අපගේ දැක්ම

2015 වර්ෂය වන විට ශ්‍රී ලාංකික සම්පත් සමුදායට අගය එකතු කිරීම සඳහා වූ දැනුම සහ විශේෂඥතා ඥානය පිළිබඳ කීර්තිමත් මධ්‍යස්ථානය බවට පත් වීම.

## 2. අපගේ මෙහෙවර

දේශීය සම්පත් සමුදායට අගය එකතු කිරීම කෙරෙහි දැඩි අවධාරණයක්ද සහිතව, පර්යේෂණයේ සහ ඉගෙනීමෙහි විශිෂ්ඨත්වයට පත් විම සහ ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි, විශේෂ උපාධි සහ සංස්ථායික මෙන්ම අඛණ්ඩ අධ්‍යාපන වෙළඳපල තුළින් සංවර්ධනය කරා විද්‍යාත්මක, තාක්ෂණික හා ව්‍යවසායික ප්‍රවේශයන් භාවිතා කිරීමෙහි සමත් සුදුසු පරිපූර්ණ නායකයින් බිහි කිරීම.

## 3. උපකුලපතිතුමාගේ සමාලෝචනය



තාක්ෂණ-පුරෝගාමී විශ්වවිද්‍යාලයක් වශයෙන් මහත් ප්‍රගතියක් පෙන්නුම් කර ඇති ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 වාර්ෂික වාර්තාව වෙනුවෙන් මෙම පණිවුඩය සටහන් කරන්නට ලැබීම ගැන මම සතුටට පත් වෙමි. 2010 වර්ෂය තුළ මෙම විශ්වවිද්‍යාලය ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීම සඳහා උත්කෘෂ්ඨත්වයේ කේන්ද්‍රයක් බවට පත් වීමේ දැක්ම හඹා යාමේ මෙහෙවර මගින් අඛණ්ඩව මෙහෙයවනු ලැබීය.

මෙම විශ්වවිද්‍යාලයේ කෙටි ඉතිහාසය තුළ ප්‍රථම වතාවට උපාධි වැඩසටහන් 11 ක් සඳහා බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 1500 ඉක්මවා ගියේය. නව පත්වීම් ලබා දෙමින් අධ්‍යයන කාර්යමණ්ඩලයද ශක්තිමත් කරන ලදී. 2005/2006 අධ්‍යයන වර්ෂයේදී මෙම විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ පළමු ශිෂ්‍ය කාණ්ඩය මෙම වර්ෂයේදී උපාධි සම්පූර්ණ කළහ.

යටිතල පහසුකම් සංවර්ධන කටයුතු 2010 වර්ෂයේදීද සිදු කරන ලද අතර, එහිදී දේශන ශාලා/පර්යේෂණාගාර, ඊ ගොඩනැගිල්ල සහ වැඩපල සංකීර්ණය (1 අදියර) යන ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව ඉදිරියට කර ගෙන යාම සහ 2 අදියර යටතේ දේශන ශාලා/ඩී සංකීර්ණයේ පර්යේෂණාගාරය ඉදිකිරීම සඳහා වූ වැඩ කටයුතු ආරම්භ කිරීමත් සිදු විය.

විශ්වවිද්‍යාලය විසින් සකස් කොට අනුමත කර ගන්නා ලද මූලික සැලැස්මේ පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට තිබූ ප්‍රධාන බාධාව 2010 අග භාගයේදී ඇති වූ නාය යාම් විය. අපට තිබූ සීමිත මුදල් ප්‍රතිපාදන ප්‍රතිකර්ම සහ අවශ්‍ය සීහුම් සඳහා භාවිතා කිරීමට සිදු විය.

සමස්තයක් වශයෙන්, අපගේ දැක්ම යථාර්ථයක් කරා ගෙන යාමෙහිලා 2010 වර්ෂය ඉතාමත් ඵලදායී සහ සාර්ථක වර්ෂයක් විය. 2010 අප අත් කර ගත් දේ හි සාර්ථකත්වය සඳහා දායක වූ සැමට මම තුති පුදමි.

මහාචාර්ය රන්ජිත් ප්‍රේමලාල් ද සිල්වා
උප කුලපති
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
2012.02.01

## 4. සම්පත් සහ ශිෂ්‍ය විස්තර

### 4.1 අධ්‍යයන පාඨමාලා සහ භාර කාර්යමණ්ඩලය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 2010 වර්ෂයේදී සිය පීඨ 3 යටතේ අධ්‍යයන පාඨමාලා 11 ක් පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කරන ලදි.

| පීඨය | අධ්‍යයන පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්යමණ්ඩලයේ මුළු සංඛ්‍යාව | අනධ්‍යයන කාර්යමණ්ඩලයේ මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය | සත්ව විද්‍යාව | 165 | 31 | අනධ්‍යයන කාර්යමණ්ඩලයේ 44 දෙනෙක් හා පරිපාලන කාර්යමණ්ඩලයේ 12 දෙනෙක් සිටි අතර, ඔවුන් පොදුවේ සිය හා සාමාන්‍ය පරිපාලනය සඳහා සේවය සැලසූහ. |
| | අපනයන කෘෂිකර්මය | 162 | | |
| | තේ තාක්ෂණවේදය සහ අගය එක් කිරීම | 133 | | |
| | ජලජ සම්පත් තාක්ෂණවේදය | 94 | | |
| | තාල හා ක්ෂිර තාක්ෂණය හා අගය එකතු කිරීම | 91 | | |
| විද්‍යා හා තාක්ෂණවේදය | විද්‍යාව හා තාක්ෂණවේදය | 169 | 42 | |
| | පරිගණක විද්‍යාව සහ තාක්ෂණවේදය | 174 | | |
| | කර්මාන්ත තොරතුරු තාක්ෂණවේදය | 148 | | |
| | ඛනිජ සම්පත් සහ තාක්ෂණවේදය | 129 | | |
| කළමනාකරණය | ව්‍යවසායකත්ව සහ කළමනාකරණ අධ්‍යයනය | 198 | 23 | |
| | සත්කාරකත්ව, සංචාරක සහ විශේෂ අවස්ථා කළමනාකරණය | 99 | | |
| **එකතුව** | | **1562** | **96** | **56** |

## 4.2 ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා මූල්‍ය ආධාර

ශිෂ්‍යයින් සඳහා මූල්‍යාධාර ලබා දෙන ලද්දේ ප්‍රධාන වශයෙන් ශිෂ්‍යාධාර සහ මහපොල ශිෂ්‍යත්ව වශයෙනි. 2005/2006, 2006/2007, 2007/2008, 2008/2009 සහ 2009/2010 යන අධ්‍යයන වර්ෂ තුළ එක් එක් විෂය ක්ෂේත්‍රය අනුව මහපොල හා ශිෂ්‍යාධාර ලාභීන් සංඛ්‍යාවන් පහත දැක්වේ. 2005/2006 අධ්‍යයන වර්ෂයේ බඳවා ගනු ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සිව් අවුරුදු උපාධි වැඩසටහන සම්පූර්ණ කරන ලද්දේ 2010 ජූලි මාසයේදී බැවින් ඔවුන්ට ඒ දක්වා මහපොල / ශිෂ්‍යාධාර ගෙවන ලදී.

| **පීඨය** | **ශිෂ්‍යාධාර** | | | | | **මහපොල** | | | | | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2005/ 2006** | **2006/ 2007** | **2007/ 2008** | **2008/ 2009** | **2009/ 2010** | **2005/ 2006** | **2006/ 2007** | **2007/ 2008** | **2008/ 2009** | **2009/ 2010** | |
| විද්‍යා සහ තාක්ෂණවේදය | 11 | 23 | 31 | 42 | 35 | 31 | 35 | 89 | 60 | 68 | **425** |
| සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය | 13 | 37 | 24 | 30 | 40 | 22 | 10 | 60 | 101 | 82 | **419** |
| කළමනාකරණය | 18 | 39 | 36 | 61 | 05 | 04 | 02 | 02 | 08 | 09 | **184** |
| **එකතුව** | **42** | **99** | **91** | **133** | **80** | **57** | **47** | **151** | **169** | **159** | **1028** |

මහපොල භාරකාරත්ව අරමුදල කුසලතා ශිෂ්‍යත්ව වශයෙන් මාසිකව රු. 2200 ක් සහ සාමාන්‍ය ශිෂ්‍යත්ව වශයෙන් මාසිකව රු. 2150 බැගින් පිරිනමන අතර එයට අමතරව විශ්වවිද්‍යාලය විසින් එක් එක් මහපොල ශිෂ්‍යත්වලාභියා වෙත මසකට රු. 350 ක් පිරිනමනු ලැබේ. එම නිසා කුසලතා ශිෂ්‍යත්ව හා සාමාන්‍ය ශිෂ්‍යත්ව පදනම අනුව එක් ශිෂ්‍යයකු පිළිවෙලින් රු. 2550 ක් හෝ රු. 2500 ක් ලබයි. එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 856 සහ එහි සංශෝධන චක්‍රලේඛ අංක 900 අනුව එක් ශිෂ්‍යයකු මසකට රු. 2000 ක හෝ රු. 1900 ක ශිෂ්‍යාධාර ලබයි.

## 4.3 නේවාසිකාගාර පහසුකම්

පළමුවන සහ තුන්වන වසරවල සියලුම ශිෂ්‍යයින් හට 2010 වර්ෂය තුළ නේවාසිකාගාර පහසුකම් ලබා දී තිබේ. විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළ ඇති නේවාසික පහසුකම්වලට අමතරව ශිෂ්‍ය නවාතැන් පහසුකම් සඳහා විශ්වවිද්‍යාලයෙන් පිටත නිවාස 8 ක් කුලියට ගන්නා ලදී.

එම නේවාසිකාගාරවල නම් සහ නවාතැන්ලාභීන් සංඛ්‍යාව පහත දැක්වේ.

| **නම** | **පිරිමි** | **කාන්තා** | **එකතුව** |
|---|---|---|---|
| **අභ්‍යන්තර නේවාසිකාගාර පහසුකම්:** | | | |
| කොරල් බියුටි | 127 | | 127 |
| සිල්වර්ටිප්ස් | 70 | | 70 |
| කැට්ලියා | | 122 | 122 |
| බ්ලූ සෆායර් | | 132 | 132 |

| | | | |
|---|---|---|---|
| **බාහිර නේවාසිකාගාර පහසුකම්:** | | | |
| නකල්ස් | | 09 | 09 |
| කැළණි | | 19 | 19 |
| වලවේ | | 09 | 09 |
| නිල්වලා | | 12 | 12 |
| හන්තාන | | 16 | 16 |
| දුන්හිඳ | | 13 | 13 |
| දියලුම | | 14 | 14 |
| සමනල | | 12 | 12 |
| වින්ටර් | 12 | | 12 |
| මහවැලි | 12 | | 12 |
| බඹරගල | 25 | | 25 |
| **එකතුව** | **246** | **358** | **604** |


## 4.4 පුස්තකාලය


ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පුස්තකාලය වනාහි මූලාශ්‍ර, සම්පත් හා සේවාවන් සහ ඒවා පිහිටුවා ඇති ව්‍යූහයයි. අධ්‍යයන පුස්තකාලයක් සිය ශිෂ්‍යයින්ගේ හා කාර්යමණ්ඩලයේ ඉගැන්වීම් හා පර්යේෂණ අවශ්‍යතා සපුරයි. මෙම පුස්තකාලය එකිනෙකට බද්ධ කාර්යයන් දෙකක් ඉටු කරයි. ඒවා නම්, විශ්වවිද්‍යාලයේ විෂයමාලාවට උපකාරී වීම හා ශිෂ්‍යයින්ගේ හා කාර්යමණ්ඩලයේ පර්යේෂණවලට උපකාර ලබා දීමයි. මෙම පුස්තකාලයේ ග්‍රන්ථ එකතුව ඩෙව් ඩෙසිමල් වර්ගීකරණ පද්ධතිය අනුව වර්ගීකරණය කර ඇත.


පුස්තකාලයේ වර්ධනය ඉතා නියත වන අතර, පෞද්ගලික පරිත්‍යාග, ආයතනික පරිත්‍යාග සහ විශ්ව විද්‍යාලය මගින් මිලදී ගන්නා ලද පොත්වලින් පුස්තකාල පොත් එකතුව සමන්විත විය. වර්තමානයේදී ශිෂ්‍යයින් හා විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය ඇතුළු පරිශීලනය කරන්නන් 1700 කට වැඩි සංඛ්‍යාවකට පුස්තකාලය පහසුකම් ලබා දෙයි. එය පුස්තකාලය පරිශීලනය කරන්නන්ට ගුණාත්මක සේවාවක් හා තොරතුරු ලබා ගැනීමේ අවස්ථාව ලබා දෙන අතර, සියළුම අනුග්‍රාහකයින්ට පුස්තකාල සේවා භාවිතා කිරීම සඳහා සර්ව සාධාරණ ලෙස අවස්ථාව ලබා දීම මගින් සැමට සෙත සලසන ඉගැන්වීම් හා ඉගෙනීම් පරිසරයක් ඇති කරයි. විශාල තොරතුරු ක්ෂේත්‍රයක් ආවරණය කරන එකතුවක් එය සතු වන අතර, එය විද්වතුන්ට විශ්වීය දැනුමකින් යුතුව පරිණාමනය වීමට උපකාර වේ.



පහත දැක්වෙන වගුවෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය වෙත මිලට ගනු ලැබූ හා පරිත්‍යාග කරන ලද ග්‍රන්ථ විස්තරාත්මකව දැක්වේ. 2010 වර්ෂයේදී රුපියල් 2,040,642 ක් වටිනා ග්‍රන්ථ 1982 ක් මිලට ගනු ලැබිය. පුස්තකාලයේ පහසුකම් ව්‍යාප්ත කිරීමට ඇති ප්‍රධානතම බාධකය වූයේ අරමුදල් සීමා වීමයි.




## පුස්තකාලය භාවිතා කිරීමේ අවස්ථාව

පුස්තකාලය සතියේ දිනවල පෙරවරු 08.00 සිට පස්වරු 07.30 දක්වා ද, සෙනසුරාදා දිනවල පෙරවරු 08.00 සිට පස්වරු 06.00 දක්වා ද, ඉරිදා දිනවල පෙරවරු 08.00 සිට පස්වරු 04.00 දක්වා ද විවෘතව පවතින අතර, රජයේ නිවාඩු දිනවල වසා තබනු ලැබේ.

## සේවාවන්

පාඨකයන්ට විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි වීමෙන් පසුව පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමෙන් පොත් ලබා ගත හැකිය. සාමාජිකයින් හට බැහැර ගෙන යාමේ හා පරිශීලන සේවාවන් සැපයේ.

සාමාජිකයින්ට අවශ්‍ය ග්‍රන්ථ පුස්තකාලයේ නොමැති නම්, අන්තර් පුස්තකාල බැහැර දීමේ යෝජනා ක්‍රමයේ සේවය ලබා ගත හැකිය.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පුස්තකාලය සතිපතා හා සති අන්තයේ පළ වන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් සමගින් ශක්තිමත් වී ඇත.

ශ්‍රී ලංකා ග්‍රන්ථ එකතුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පුස්තකාලය විසින් ලබා දෙනු ලබන සුවිශේෂී පහසුකම්වලින් එකක් වන අතර එය මව් බිම පිළිබඳ විවිධ විෂයන් සම්බන්ධයෙන් ග්‍රන්ථ හා වෙනත් ප්‍රකාශන 500 කින් සමන්විත වෙයි. පාඨකයන් හට ඌව පළාත පිළිබඳ දැනුවත් විය හැකි වනු පිණිස ඌව පළාත ආශ්‍රිත තොරතුරු සහිත පහසුකම් සහ ග්‍රන්ථ එකතුව වෙනම සපයා තිබේ.

## ග්‍රන්ථ බැහැර දීමේ සේවාව

බැහැර දීමේ අංශයේ ග්‍රන්ථ වර්ග දෙකකි. ඉන් එකක් 'එල්' ලෙසද, අනෙක 'එස්.ආර්' ලෙසද නම් කර ඇත. 'එල්' වර්ගයේ ග්‍රන්ථ දින 14 ක කාලයක් සඳහාද 'එස්.ආර්' වර්ගයේ ග්‍රන්ථ පසු දින ආපසු භාර දීම සඳහාද ගෙන යා හැකි වන අතර, පුස්තකාල ග්‍රන්ථ බැහැර ගෙන යාම සඳහා පාඨකයින් සිය පුස්තකාල සාමාජික පත්‍ර සහ විශ්වවිද්‍යාලීය හැඳුනුම් පත ඉදිරිපත් කළ යුතුය.

## පරිශීලන සේවාව

ශබ්දකෝෂ, විශ්වකෝෂ, අත්පොත් සහ ව්‍යාපෘති වාර්තා වැනි පරිශීලන ද්‍රව්‍ය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පුස්තකාලය සතුව ඇති අතර ඒවා පුස්තකාලයෙන් බැහැර දෙනු නොලැබේ. පාඨකයින්ට සංසරණ කවුළුවෙන් පෙර විභාග ප්‍රශ්න පත්‍ර සහ සංයුක්ත තැටි (සී.ඩී.) පැයක කාලයක් සඳහා ලබා ගත හැකිය.

පුවත්පත්වල ලිපි එකතුවක්ද දෛනික පදනමින් පරිශීලන (ආශ්‍රිය) අංශයෙන් ලබා ගත හැකිය. එයට:

- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ලිපි හා කෘති
- උපාධි වැඩසටහන්වලට අදාළ ලිපි හෝ කෘති
- ජෛව විවිධත්වය
- විශ්වවිද්‍යාලයේ වෙනත් ලිපි හා කෘති
- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ දැන්වීම්

ඇතුළත් වේ. වාර සඟරා ප්‍රකාශන එකතුවෙහි සඟරා 500ක ට වඩා ඇත. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ව්‍යවසායකත්වය සහ නව නිපැයුම්, ව්‍යවසායකත්වය සහ කුඩා ව්‍යාපාර, ජාතික භූගෝල විද්‍යා, අර්ථ ශාස්ත්‍රඥයා සහ පාඨක රුචිය වැනි සඟරාවල දායකත්වය ලබා ගෙන තිබේ. ආයතන කීපයකින් නොමිලේ ලැබෙන සඟරා කීපයක්ද ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පුස්තකාලයේ ඇත.

## 4.5 යටිතල පහසුකම් සංවර්ධනය

කොන්ත්‍රාත්තුව ලබා දී තිබූ දේශන ශාලාව / රසායනාගාරය සහිත ඊ - ගොඩනැගිල්ල සහ වැඩපල සංකීර්ණයේ 1 අදියර ඉදිකිරීම් කටයුතු 2010 වර්ෂය තුළද සිදු කෙරුණි.

වැඩපල සංකීර්ණයේ 2 අදියර, ජල පිරිපහදුව සහ දේශන ශාලාව / රසායනාගාරය සහිත ඩී - ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට
පවරන ලදී.

2010 වර්ෂය අග භාගයේදී ඇති වූ තද වැසි, නාය යාම් ආදිය මගින් ඉදිකිරීමේහි ප්‍රගතිය බෙහෙවින් අඩාල වූ අතර සිදු කෙරෙමින් ඇති වැඩ සඳහා ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන සීමාසහිත විය.

## 4.6 ශිෂ්‍ය උපදේශනඥයෝ

පහත සඳහන් අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් ශිෂ්‍ය උපදේශනඥයින් වශයෙන් කටයුතු කළහ. විවිධ උපදේශන ක්ෂෙත්‍ර හඳුනා ගනු ලැබූ අතර, එක් එක් ක්ෂේත්‍රය වෙනුවෙන් උපදේශනඥයින් පත් කරන ලදි.

| නම | උපදේශන ක්ෂේත්‍ර |
|---|---|
| එල්.එම්.එච්.ආර්.අල්විස් මහත්මිය | • ආහාර |
| ආචාර්ය ඒ.එම්.ඒ.එන්.බී.අත්තනායක මහතා | • අධ්‍යයන සහ උපදෙස් |
| එච්.එම්.ඩබ්ලිව්.එම්. හේරත් මිය | • විනෝදාශ්වාද හා සාමාජික කටයුතු |
| කේ.ඒ.ජී.සී. කහඳව මහතා | • උපයෝගිතා |
| එම්.රුබවදනන් මහතා | • ක්‍රීඩා |
| ජනක සියඹලාපිටිය මහතා | • නේවාසිකාගාර (නවාතැන්, භාරකරුවන්, ආරක්ෂක) |
| ටී.එම්.පී.එස්.අයි.තෙන්නකෝන් මහතා | • ආගමික කටයුතු |
| ආචාර්ය එච්.ඩබ්ලිව්.එම්.ඒ.සී.විජයසිංහ මහතා | • වෘත්තීය සංවර්ධනය |
| ආචාර්ය ආර්.ආර්.එම්.කේ.කේ. විජේසුන්දර මහතා | • ශිෂ්‍ය සංවිධාන හා විශ්වවිද්‍යාල සංස්කෘතිය (ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක) |

## 4.7 සෞඛ්‍ය පහසුකම්

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය බාහිරින් පැමිණෙන වෛද්‍ය නිලධාරියකුගෙන් යුතුව 2010.06.30 දින දක්වා ද, කොන්ත්‍රාත් පදනමින් පත් කරන ලද වෛද්‍ය නිලධාරියකු සහිතව 2010.07.01 දක්වාද ක්‍රියාත්මක විය. එක් හෙදියක් සහ එක් මෙහෙයුම් නිලධාරියෙක්ද අර්ධ-කාලීන පදනමින් සේවය කරන අතර සෑම වැඩ කරන දිනයකම පැය 08.30 සිට 16.30 දක්වා විවෘතව තබනු ලැබේ.


# 5. දේශීය ශිෂ්‍ය විස්තර

## 2009/2010 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ


ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සෑම වර්ෂයකදීම එක් එක් උපාධි වැඩසටහනක් සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 50 දෙනකු බැගින් පමණක් බඳවා ගනී. ඔවුන් තෝරා ගනු ලැබුවේ අ.පො.ස. උසස් පෙළ විභාගයේදී ලබා ඇති ප්‍රතිඵල සහ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අභියෝගිතා පරීක්ෂණයකදී ඔවුන් දක්වන කාර්යසාධනය පදනම් කර ගෙනය. 2010 වර්ෂයේදී (2009/2010) අධ්‍යයන වර්ෂයේදී ලියාපදිංචි වූ සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවෝ දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවෝ වූහ. එක් එක් උපාධි වැඩසටහනක් සඳහා එක් එක් පීඨය යටතේ ලියාපදිංචි වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව පහත දක්වා ඇත.

| පීඨය | අධ්‍යයන පාඨමාලාව | මාධ්‍යය | 2010 ඇතුළත් කර ගත් ශිෂ්‍ය සංඛ්‍යාව | පළමු වසර | දෙවන වසර | තුන්වන වසර | සිව්වන වසර | උපාධිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය | සත්ව විද්‍යාව | ඉංග්‍රීසි | 42 | 42 | 43 | 46 | 34 | 28 |
| | අපනයන කෘෂිකර්මය | ඉංග්‍රීසි | 42 | 42 | 43 | 41 | 36 | 27 |
| | තේ තාක්ෂණවේදය සහ අගය එක් කිරීම | ඉංග්‍රීසි | 42 | 42 | 45 | 46 | -- | -- |
| | ජලජ සම්පත් තාක්ෂණවේදය | ඉංග්‍රීසි | 45 | 45 | 49 | -- | -- | -- |
| | තාල හා ක්ෂිර තාක්ෂණය හා අගය එකතු කිරීම | ඉංග්‍රීසි | 41 | 41 | 50 | -- | -- | -- |
| විද්‍යා හා තාක්ෂණවේදය | විද්‍යා හා තාක්ෂණවේදය | ඉංග්‍රීසි | 47 | 47 | 38 | 42 | 42 | 34 |
| | පරිගණක විද්‍යාව සහ තාක්ෂණවේදය | ඉංග්‍රීසි | 45 | 45 | 43 | 44 | 42 | 32 |
| | කර්මාන්ත තොරතුරු තාක්ෂණවේදය | ඉංග්‍රීසි | 48 | 48 | 49 | 51 | -- | -- |
| | ඛනිජ සම්පත් සහ තාක්ෂණවේදය | ඉංග්‍රීසි | 39 | 39 | 39 | 51 | -- | -- |
| කළමනාකරණය | ව්‍යවසායකත්ව සහ කළමනාකරණ අධ්‍යයනය | ඉංග්‍රීසි | 47 | 47 | 54 | 50 | 47 | 32 |
| | සත්කාරකත්ව, සංචාරක සහ විශේෂ අවස්ථා කළමනාකරණය | ඉංග්‍රීසි | 49 | 49 | 50 | -- | -- | -- |
| **එකතුව** | | | **487** | **487** | **503** | **371** | **201** | **153** |

## 2010 වර්ෂයේ අභිනව බඳවා ගැනීම්වල ස්ත්‍රී පුරුෂ බෙදී යාම



## 2010 වර්ෂයේ උපාධිලාභීන්ගේ ස්ත්‍රී පුරුෂ බෙදී යාම




## 6. විදේශ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ

මෙම විශ්වවිද්‍යාලයට තවමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් විදේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලැබී නැත.

# 7. අධ්‍යයන කාර්යමණ්ඩලය

## 7.1 2010 වර්ෂයේදී අධ්‍යයන ප්‍රභේදයේ සමස්ත මානව සම්පත

| පීඨය | විෂය ක්ෂේත්‍රය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහකාර කථිකාචාර්ය | ප්‍රදර්ශක / උපදේශක | අධ්‍යයන නිවාඩු ලබා සිටින කථිකාචාර්යවරු |
|---|---|---|---|---|---|---|---|---|---|
| සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්මය | සත්ව විද්‍යාව | ඉංග්‍රීසි | - | (1) | 1+(5)+5* | 8+(22) | (5) | - | - |
| | අපනයන කෘෂිකර්මය | ඉංග්‍රීසි | (1) | - | 1+(21) | 7+(4) | 1 | 8 | - |
| | තේ තාක්ෂණවේදය සහ අගය එක් කිරීම | ඉංග්‍රීසි | | | | | | | |
| | තාල හා ක්ෂිර තාක්ෂණය හා අගය එකතු කිරීම | ඉංග්‍රීසි | | | | | | | |
| | ජලජ සම්පත් තාක්ෂණවේදය | ඉංග්‍රීසි | - | (1) | 4+1* | - | 2 | - | - |
| විද්‍යා සහ තාක්ෂණවේදය | විද්‍යාව හා තාක්ෂණවේදය | ඉංග්‍රීසි | - | - | 3+(7) | 14+9*+(3) | - | 3+1* | 6 |
| | පරිගණක විද්‍යාව සහ තාක්ෂණවේදය | ඉංග්‍රීසි | - | - | 1+1* | 1+7* (2) | 3+1* | 4 | 2 |
| | කර්මාන්ත තොරතුරු තාක්ෂණවේදය | ඉංග්‍රීසි | - | - | 1+1* | 1+2* (2) | 3+4* | 3 | 2 |
| | ඛනිජ සම්පත් සහ තාක්ෂණවේදය | ඉංග්‍රීසි | - | - | 1+(3) | 2+6*+(2) | - | 1* | - |
| කළමනාකරණය | ව්‍යවසායකත්ව සහ කළමනාකරණ අධ්‍යයනය | ඉංග්‍රීසි | - | - | 1+1* | 10+(2)+5* | - | - | - |
| | සත්කාරකත්ව, සංචාරක සහ විශේෂ අවස්ථා කළමනාකරණය | ඉංග්‍රීසි | - | - | - | 1+(1)+4* | - | - | - |
| | පුළුල් සාමාන්‍ය අධ්‍යාපනය සහ අත්‍යවශ්‍ය කුසලතා | ඉංග්‍රීසි/සිංහල/ දෙමළ | - | - | 1+1* | 6+(2)+8* | - | - | 3 |
| **එකතුව** | | | (1) | (2) | 14+(36)+10* | 50+(40)+4 1 | 09+(5)+5* | 20+2* | 13 |

වෙනත් පීඨවලට අයත්, තමන් අයත් නොවන පීඨයක උපාධි වැඩසටහන සඳහා සේවය සලසන කථිකාචාර්යවරුන් සංඛ්‍යාව තරු (*) ලකුණකින් සලකුණු කර ඇත.
බැහැරින් පැමිණෙන ආරාධිත කථිකාචාර්යවරුන් සංඛ්‍යාව වරහන් () තුළ දක්වා ඇත.

**සටහන:** උපාධි වැඩසටහන්වල පුළුල් විෂය ක්ෂේත්‍රයන්ට අමතරව, 12 වන පුළුල් විෂය ක්ෂේත්‍රය ලෙස දක්වා ඇති පුළුල් සාමාන්‍ය අධ්‍යාපනය සහ අත්‍යවශ්‍ය කුසලතා ද ඉගැන්වීමෙහි නිරත කථිකාචාර්යවරුන්ද සිටී.

## 7.2 සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය



සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය අධ්‍යයනාංශ දෙකකින්, එනම් සත්ව විද්‍යා අධ්‍යයනාංශයෙන් සහ අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශයෙන් සමන්විත වේ. ආචාර්ය ජී. චන්ද්‍රසේන පීඨයේ පීඨාධිපති වශයෙන් සේවය කළේය. ආචාර්ය එස්.ඩී.ජයමාන්න සත්ව විද්‍යා අධ්‍යානාංශ ප්‍රධානි ලෙස සහ සත්ව විද්‍යා උපාධි වැඩසටහනේ පාඨමාලා අධ්‍යක්ෂ වශයෙන් සේවය සැලසීය. ආර්.ඒ.පී.අයි.සම්පත් ධර්මදාස මහතා අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශ ප්‍රධානි ලෙස සේවය සැලසීය.

එච්.ඒ.එස්.එල්. ජයසිංහ මිය, ඩබ්ලියු.ඒ.එන්.ටී. ද සිල්වා මිය, එස්.එම්.පී.ජී. බණ්ඩාර මිය සහ ආර්.එම්.එස්.ඩී. රත්නායක මිය 2010 නොවැම්බර් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තාවකාලික ප්‍රදර්ශකවරුන් වශයෙන් පත් කරන ලදි. තාවකාලික කථිකාචාර්ය එම්.ඩී.එන්. ප්‍රියදර්ශනී මිය පෞද්ගලික හේතු මත සිය තනතුරින් ඉල්ලා අස් වූවාය.

2010 වර්ෂය සඳහා සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නම්, සුදුසුකම් සහ තනතුරු නාමයන් පහත දැක්වේ.

**ආචාර්ය ජී. චන්ද්‍රසේන,** බී.එස්.සී. කෘෂි. (ශ්‍රී ලංකා), එම්.එස්.සී. (කැළණිය), එම්.ෆිල්. (පේරාදෙණිය), පී.එච්.ඩී. (එක්සත් රාජධානිය), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය, පීඨාධිපති.

**ආචාර්ය එස්.සී. ජයමාන්න,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), එම්.ෆිල්. (ශ්‍රී ජයවර්ධනපුර), පී.එච්.ඩී (ස්කොට්ලන්තය), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය / සත්ව විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධානී.

**ආර්.ඒ.පී.අයි.එස්. ධර්මදාස මහතා,** බී.එස්.සී. (රුහුණ), කථිකාචාර්ය (පරිවාස), අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශයේ ප්‍රධානී.

**ආර්.එම්.සී.ඩබ්ලියු. එම්. රත්නායක මිය,** බී.ඒ. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස) (අධ්‍යයන නිවාඩු ලබා සිටී.)

**ඊ.කේ.එන්.ඩී. ප්‍රනාන්දු මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**ඩී.කේ.ඩී.ඩී. ජයසේන මහතා,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**පී.ඊ. කාලියදාස මිය,** බී.එස්.සී. (රුහුණ), එම්.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**පී.බී.ඒ.අයි.කේ. බුළුමුල්ල මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**එස්.ආර්.ඩබ්ලියු.එම්.සී.ජේ.කේ. රණවන මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**ආර්.ආර්.එම්.කේ.කේ. විජේසුන්දර මහතා,** බී.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**ඩී.සී. මුදන්නායක මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.එස්.සී. (මෙල්බන්), කථිකාචාර්ය (පරිවාස)

**සී.පී. අබේසේකර මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.එස්.සී. (පේරාදෙණිය),කථිකාචාර්ය (පරිවාස)

**ර්.ඩී.එන්.එස්. අබේරත්න මහතා**, බී.එස්.සී. (පේරාදෙණිය), එම්.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**එච්.එම්.එස්.කේ. හේරත් මහතා**, බී.එස්.සී. (සබරගමුව), එම්.එස්.සී. (බෙල්ජියම), කථිකාචාර්ය (පරිවාස) අධ්‍යයන නිවාඩු ලබා සිටී.)

**එල්.එම්.එච්.ආර්.අල්විස් මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**එම්.ජී.පී.පී.මහින්දරත්න මහතා,** බී.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**පී.ආර්.ඩී. ගුණතිලක මිය,** බී.එස්.සී. (වයඹ), කථිකාචාර්ය (පරිවාස)

**ජ්.එම්. සමරවීර මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**එන්.එම්.එන්. නම්බපාන මිය,** බී.එස්.සී. (සබරගමුව), එම්.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**එන්.පී.පී. ලියනගේ මහතා,** බී.එස්.සී. (රුහුණ), කථිකාචාර්ය (පරිවාස) (2010.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ජ්.එම්.එන්.එල්. අබේසිංහ,** බී.එස්.සී. (පේරාදෙණිය), තාවකාලික කථිකාචාර්ය (2010.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ආර්.එම්.ජී.එන්. රාජපක්ෂ මිය,** බී.එස්.සී. (රජරට), තාවකාලික කථිකාචාර්ය (2010.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**එන්.එස්. විතානගේ මිය,** බී.එස්.සී. (රුහුණ , තාවකාලික ප්‍රදර්ශක

**ජ්.ජ්.එම්. සුබෝධිනී මිය,** බී.එස්.සී. (රුහුණ), තාවකාලික ප්‍රදර්ශක

**ජී.ජී.එන්. තුෂාරි මිය,** බී.එස්.සී. (රුහුණ), තාවකාලික ප්‍රදර්ශක (2010.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ඩී.එස්.කේ. නාගහතැන්න මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.ෆිල්. (පේරාදෙණිය), තාවකාලික ප්‍රදර්ශක

**එච්.එම්.පී.ටී.කේ. හෙට්ටිගෙදර මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), තාවකාලික ප්‍රදර්ශක

**එච්.ජ්.එස්.එල්. ජයසිංහ මිය,** බී.එස්.සී. (ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය), තාවකාලික ප්‍රදර්ශක (2010.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ඩබ්ලියු.ජ්.එන්.ටී. ද සිල්වා මිය,** බී.එස්.සී. (ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය), තාවකාලික ප්‍රදර්ශක (2010.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ආර්.එම්.එස්.ඩී. රත්නායක මිය,** බී.එස්.සී. (ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය), තාවකාලික ප්‍රදර්ශක (2010.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**එස්.එම්.පී.බී. බානාදර මිය,** බී.එස්.සී. (ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය), තාවකාලික ප්‍රදර්ශක (2010.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

## 7.3 කළමනාකරණ පීඨය

ආචාර්ය එස්.ජී. සිවගුරුනාදන් කළමනාකරණ පීඨයේ පීඨාධිපති වශයෙන් කටයුතු කළේය. කළමනාකරණ විද්‍යා අධ්‍යනාංශයේ ප්‍රධානී ලෙස කළින් කටයුතු කළ පී.අයි.එන්.ප්‍රනාන්දු මිය උසස් අධ්‍යයන කටයුතු සඳහා පිටව ගිය බැවින්, සන්ධ්‍යා නිල්මිණි මිය කළමනාකරණ විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධානී වශයෙන් පත් කරනු ලැබුවාය. ආචාර්ය ටී. අතාවුද අඛණ්ඩව ව්‍යවසායකත්ව සහ කළමනාකරණ උපාධි වැඩසටහනේ වැඩ බලන පාඨමාලා අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළේය. තවද, ආචාර්ය එස්.ජී. සිවගුරුනාදන් සත්කාරක, සංචාරක සහ විශේෂ අවස්ථා කළමනාකරණ උපාධි වැඩසටහනේ පාඨමාලා අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළේය.

2010 වර්ෂය සඳහා කළමනාකරණ පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නම්, සුදුසුකම්, සහ තනතුරු නාමයන් පහත දැක්වේ.

**ආචාර්ය එස්.ජී. සිවගුරුනාදන්,** බී.ඒ. (මයිසෝර්), එම්.ඒ. (යාපනය), පී.එච්.ඩී. (මයිසෝර්) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - 1 ශ්‍රේණිය - වැඩ බලන පීඨාධිපති

**පී.අයි.එන්. ප්‍රනාන්දු මිය,** බී.කොම් (ශ්‍රී ජයවර්ධනපුර), එම්.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස), කළමනාකරණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානී (2010.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යයන නිවාඩු ලැබීය.)

**පී.එච්.ටී. කුමාර මහතා,** බී.ඒ. (පේරාදෙණිය), අර්ථ ශාස්ත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (හේග්) කථිකාචාර්ය (පරිවාස), (අධ්‍යයන නිවාඩු ලබා සිටී.)

**එච්.එම්.ඩබ්ලියු.එම්. හේරත් මිය,** බී.ඒ. (කැළණිය), එම්.ෆිල් (කැළණිය), කථිකාචාර්ය (පරිවාස)

**ටී.ඒ.සී.ජේ.එස්. බණ්ඩාර මිය,** බී.ඒ. (කොළඹ), පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**ටී.එම්.පී.එස්.අයි. තෙන්නකෝන් මහතා,** බී.ඒ. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**එම්. රුබවදනන් මහතා,** බී.ඒ. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**ජී.එච්. අබේවීර මහතා,** බී.ඒ. (සබරගමුව), ටී.ඊ.එල්.එල්. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ශ්‍රී ජයවර්ධනපුර), කථිකාචාර්ය (පරිවාස) (අධ්‍යයන නිවාඩු ලබා සිටියේය.)

**එච්.ආර්.එන්. පීරිස් මිය,** බී.ඒ. (කැළණිය), එම්.ඒ. (බ.සහ පී. ශ්‍රී ලංකාව), එම්.ෆිල් (කැළණිය), කථිකාචාර්ය (පරිවාස)

**ඒ.යූ.එච්. ගුණවර්ධන මිය,** බී.එස්.සී. කෘෂිකර්මය (පේරාදෙණිය), එම්.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස), (අධ්‍යයන නිවාඩු ලබා සිටියේය.)

**ඒ.ඒ.කේ.කේ. ජයවර්ධන මිය,** බී.කොම් (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**ජනක සියඹලාපිටිය මහතා,** බී.කොම් (ඉන්දියාව), ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (එංගලන්තය), කථිකාචාර්ය (පරිවාස)

**කේ.එම්.ආර්. සිරිවර්ධන මිය,** බී.ඒ. (සබරගමුව), කථිකාචාර්ය (පරිවාස)

**ජේ.පී.ආර්.සී. රණසිංහ මහතා,** බී.එස්.සී. (රජරට), පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (රජරට) කථිකාචාර්ය (පරිවාස)

**ඩබ්ලියු.එම්.පී.ජී.සී. වීරකෝන් මිය,** බී.කොම් (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස) (2010.05.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ජේ. සුදා මිය,** බී.බී.ඒ. (නැගෙනහිර වි.වි. ශ්‍රී ලංකාව), පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (නැගෙනහිර වි.වි. ශ්‍රී ලංකාව), එම්.බී.ඒ. (නැගෙනහිර වි.වි. ශ්‍රී ලංකාව), කථිකාචාර්ය (පරිවාස) (2010.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ඩී.එන්.එන්. රොහාන් මහතා,** බී.බී.ඒ. (කොළඹ), කථිකාචාර්ය (පරිවාස)

**කේ.එම්.එම්.සී.බී. කුලතුංග මහතා,** බී.එස්.සී. (සබරගමුව), කථිකාචාර්ය (පරිවාස)

**ආර්.ඩී.එන්. පල්ලියගේ මහතා,** බී.ඒ. (පේරාදෙණිය) කථිකාචාර්ය (පරිවාස)

**වයි.එම්.සී. ගුණරත්න මිය,** බී.එස්.සී. (වයඹ), කථිකාචාර්ය (පරිවාස)

**පූජ්‍ය පී. වාචිස්සර හිමි,** බී.ඒ. (ඉන්දියාව), එම්.එස්.සී. (ඉන්දියාව), තාවකාලික කථිකාචාර්ය (2010.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ජේ.එම්.පී.වී.කේ. ජයසුන්දර මිය,** බී.ඒ. (සබරගමුව) තාවකාලික ප්‍රදර්ශක

**කේ.ඒ.ඩී.යූ. විජේනායක මිය,** බී.ඒ. (කැළණිය) තාවකාලික ප්‍රදර්ශක

**ඩී.අයි.පී. ද සිල්වා මිය,** බී.එස්.සී. (ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය) තාවකාලික ප්‍රදර්ශක (2010.06.12. දින සිට ක්‍රියාත්මක වන පරිදි)

## 7.4 විද්‍යා සහ තාක්ෂණවේද පීඨය

විද්‍යා සහ තාක්ෂණවේද පීඨය අධ්‍යයනාංශ දෙකකින්, එනම් විද්‍යා සහ තාක්ෂණවේද අධ්‍යයනාංශය සහ පරිගණක විද්‍යා සහ තාක්ෂණවේද අධ්‍යයනාංශය යන දෙකෙන් සමන්විත ය. ආචාර්ය ඒ.එම්.ඒ.එන්.බී. අත්තනායක විද්‍යා සහ තාක්ෂණවේද අධ්‍යයනාංශයේ ප්‍රධානී වශයෙන් සහ පරිගණක විද්‍යා සහ තාක්ෂණවේද අධ්‍යයනාංශයේ වැඩබලන ප්‍රධානී වශයෙන් සේවය කළේය.

2010 වර්ෂය සඳහා කළමනාකරණ පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නම්, සුදුසුකම් සහ තනතුරු නාමයන් පහත දැක්වේ.

**ආචාර්ය එස්.සී. ජයමාන්න,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), එම්.ෆිල්. (ශ්‍රී ජයවර්ධනපුර), පී.එච්.ඩී. (ස්කොට්ලන්තය) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය, වැඩබලන පීඨාධිපති.

**ආචාර්ය ඒ.ආර්.කුමාරසිංහ,** බී.එස්.සී. (රුහුණ), එම්.ෆිල්. (රුහුණ), පී.එච්.ඩී. (එක්සත් රාජධානිය) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය, (ජාතික නැනෝ තාක්ෂණවේද මූලකෘත්‍යයේ සේවය කරනු පිණිස විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය වෙත මුදා හරින ලදි.

**ආචාර්ය කේ.බී. විජේසේකර,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.ෆිල්. (පේරාදෙණිය), පී.එච්.ඩී. (ජර්මනිය), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය

**ආචාර්ය ඒ.එම්.ඒ.එන්.බී. අත්තනායක,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.එස්.සී. (නෙදර්ලන්තය), පී.එච්.ඩී (ජර්මනිය), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය, විද්‍යා සහ තාක්ෂණවේද අධ්‍යයනාංශයේ ප්‍රධානී සහ පරිගණක විද්‍යා සහ තාක්ෂණවේද අධ්‍යයනාංශයේ වැඩබලන ප්‍රධානී.

**ආචාර්ය පී.එම්. සිරිමාන්න,** බී.එස්.සී. (රුහුණ), එම්.ෆිල්. (ශ්‍රී ජයවර්ධනපුර), පී.එච්.ඩී. (ටෝකියෝ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය

**ආචාර්ය එච්.ඩබ්ලියු.එම්.ඒ.සී. විජයසිංහ,** බී.එස්.සී. (පේරාදෙණිය), එල්.අයි.සී. (ඉංජිනේරු), පී.එච්.ඩී. (ස්වීඩනය), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය

**ඊ.පී.එස්.කේ. එදිරිවීර මහතා,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), එම්.ෆිල්. (ශ්‍රී ජයවර්ධනපුර), පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ක්‍යුබෙක්), කථිකාචාර්ය (පරිවාස), (අධ්‍යයන නිවාඩු ලබා සිටියේය.)

**එම්.ඒ.පී.එන්. පෙරේරා මහතා,** බී.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස), (අධ්‍යයන නිවාඩු ලබා සිටියේය.)

**එච්.එම්.ඩී.බී. ගුණසේකර මහතා,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.එස්.සී. (නව මෙක්සිකෝ රාජ්‍ය වි.වි.) කථිකාචාර්ය (පරිවාස), (අධ්‍යයන නිවාඩු ලබා සිටියේය.)

**ඩී.ඩී.සී. ද සිල්වා මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස), (අධ්‍යයන නිවාඩු ලබා සිටියේය.)

**ඩබ්ලියු.කේ.අයි.එල්. වන්නිආරච්චි මහතා,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), කථිකාචාර්ය (පරිවාස) (අධ්‍යයන නිවාඩු ලබා සිටියේය.)

**කේ.ඩබ්ලියු.එස්.එන්. කුමාරි මිය,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), එම්.එස්.සී. (පේරාදෙණිය) කථිකාචාර්ය (පරිවාස)

**එම්.කේ.ඒ.ජේ. මල්දෙණිය මහතා,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), කථිකාචාර්ය (පරිවාස), (අධ්‍යයන නිවාඩු ලබා සිටියේය.)

**ඒ.ආර්. නිහිමියා මිය,** බී.එස්.සී. ඉංජිනේරු (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**එච්.ඒ.පී.කේ. හෙට්ටිආරච්චි මහතා,** බී.එස්.සී. (කොළඹ), කථිකාචාර්ය (පරිවාස), (අධ්‍යයන නිවාඩු ලබා සිටියේය.)

**එම්.එම්.එස්.එන්. ප්‍රේමතිලක මිය,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), කථිකාචාර්ය (පරිවාස)

**කේ.ඒ.ජී.සී. කහඳව මහතා,** බී.එස්.සී. ඉංජිනේරු (පේරාදෙණිය), එම්.එස්.සී. (මොරටුව), කථිකාචාර්ය (පරිවාස), (අධ්‍යයන නිවාඩු ලබා සිටියේය.)

**ටී.එච්.එන්.ජී. අමරවීර,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.ෆිල්. (පේරාදෙණිය) කථිකාචාර්ය (පරිවාස)

**ඒ.පී. හීන්ගමගේ මහතා,** බී.එස්.සී. (කොළඹ), කථිකාචාර්ය (පරිවාස)

**අයි.ඩී. සිංහලගේ මිය,** බී.එස්.සී. (කැළණිය), කථිකාචාර්ය (පරිවාස)

**ඩී.ටී.උඩගෙදර මහතා,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.එස්.සී. (එක්සත් රාජධානිය), කථිකාචාර්ය (පරිවාස)

**ජේ.එම්.එල්.සී. පියතිලක මහතා,** බී.එස්.සී. ඉංජිනේරු (මොරටුව), කථිකාචාර්ය (පරිවාස)

**ඒ.ඒ.කේ. කරුණාතිලක මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**ජී.එම්.ඒ.යූ.කේ. ගන්නොරුව මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**එච්.ජී.කේ. දිනේශරත්න මහතා,** බී.එස්.සී. (පේරාදෙණිය), සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පේරාදෙණිය), කථිකාචාර්ය (පරිවාස)

**බී.ඒ.කේ. දිසානායක මහතා,** බී.එස්.සී. (රුසියාව), කථිකාචාර්ය (පරිවාස)

**පී.බී. රත්නවීර මිය,** බී.එස්.සී. (කොළඹ), කථිකාචාර්ය (පරිවාස)

**කේ.ඩබ්ලියු.එම්.එම්.පී. වාසල මහතා,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), කථිකාචාර්ය (පරිවාස) (2010.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ආර්.එම්.සී.ටී.බී. ඒකනායක මහතා,** බී.එස්.සී. ඉංජිනේරු (පේරාදෙණිය), පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පේරාදෙණිය) එම්.එස්.සී (සිංගප්පූරුව), කථිකාචාර්ය (පරිවාස)

**එන්.ටී.එස්.ජී. ගමාච්චිගේ මහතා,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), කථිකාචාර්ය (පරිවාස)

**ජේ.අයි. රණසිංහ මිය,** බී.එස්.සී. (කැළණිය), එම්.එස්.සී (ජපානය), කථිකාචාර්ය (පරිවාස) (2010.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ඩී.එච්.එන්. පෙරේරා මිය,** බී.එස්.සී. (මොරටුව), එම්.එස්.සී. (මොරටුව), කථිකාචාර්ය (පරිවාස)

**ඒ.ජේ.එම්.කේ. විජේරත්න මහතා,** බී.එස්.සී. (කොළඹ), එම්.එස්.සී. (කොළඹ), පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ), තාවකාලික කථිකාචාර්ය

**කේ.එස්.ඩී. කුමාරපතිරණ මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), තාවකාලික කථිකාචාර්ය

**ආචාර්ය ජේ.එම්.ජී.එස්.බී. ජයසිංහ,** බී.එස්.සී. (පේරාදෙණිය), එම්.එස්.සී. (ඇමෙරිකා එක්සත් ජනපදය), තාවකාලික කථිකාචාර්ය

**එම්.ඉසෙඩ්.එම්. සාහීර් මහතා.** බී.එස්.සී. (පේරාදෙණිය), තාවකාලික ප්‍රදර්ශක

**එම්.එම්.ජී. මධුසිංහ මිය,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), තාවකාලික ප්‍රදර්ශක

**එච්.ඒ.සී.එස්. හපුආරච්චි මහතා,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), තාවකාලික ප්‍රදර්ශක

**එල්.ඩී.සී.එස්. සුභාෂිණී මිය,** බී.එස්.සී. (කොළඹ), තාවකාලික ප්‍රදර්ශක (2010.02.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**එච්.ආර්.එච්.අයි. සිරිකුමාර මිය,** බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), තාවකාලික ප්‍රදර්ශක (2010.12.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ඩබ්ලියු.එම්.එන්.එස්. විමලරත්න මහතා,** බී.එස්.සී. (මොරටුව), තාවකාලික ප්‍රදර්ශක (2010.02.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**ඩී.ඩබ්ලියු.සී.පී. කුමාරි මිය,** බී.එස්.සී. (කොළඹ), තාවකාලික ප්‍රදර්ශක

**ජී.එම්.ඩබ්ලියු.එම්. ආරියරත්න මිය,** බී.එස්.සී. (ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණවේද ආයතනය), තාවකාලික ප්‍රදර්ශක

**යූ.පී.පී.ආර්. පියසිංහ මහතා,** බී.එස්.සී. (පේරාදෙණිය), තාවකාලික ප්‍රදර්ශක (2010.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**එස්.ඩී.එච්.එස්. වික්‍රමරත්න මිය,** බී.එස්.සී. (පේරාදෙණිය), තාවකාලික ප්‍රදර්ශක (2010.11.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

## 8. අනධ්‍යයන කාර්යමණ්ඩලය

| පීඨය/ශාඛාව | වඩාත් ජ්‍යෙෂ්ඨ | ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය | කණිෂ්ට කාර්යමණ්ඩලය | සෙසු සේවකයෝ |
|---|---|---|---|---|
| උපකුලපතිතුමාගේ කාර්යාලය | | | 01 | මෙම විශ්වවිද්‍යාලය කිසිදු සුළු සේවකයකු බඳවා ගෙන නැත. කණිෂ්ට කාර්යමණ්ඩලයේ බොහෝ දෙනෙක් මෙහෙයුම් සහකාරවරු වූ අතර ඔවුන්ට එක් එක් කාර්යයෙහි විවිධාකාර කටයුතු රාශියක් සිදු කිරීමට සිදු විය. |
| ලේඛකාධිකාරීතුමියගේ කාර්යාලය | 01 | | 01 | |
| සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය | | | 02 | |
| විද්‍යා සහ තාක්ෂණවේද පීඨය | | | 03 | |
| කළමනාකරණ පීඨය | | | 02 | |
| ශිෂ්‍ය කටයුතු අංශය | | 01 | 04 | |
| මානව සම්පත් අංශය | | 01 | 02 | |
| පොදු පරිපාලන අංශය | | 01 | 03 | |
| විභාග අංශය | | 01 | 04 | |
| ප්‍රසම්පාදන අංශය | | 01 | 02 | |
| මූල්‍ය අංශය | | 04 | 07 | |
| වෛද්‍ය මධ්‍යස්ථානය | | 01 | 01 | |
| ව්‍යාපෘති | | 01 | 02 | |
| **එකතුව** | **01** | **11** | **34** | |

ඉහත පුළුල් අනධ්‍යයන කාර්යමණ්ඩලයට අනධ්‍යයන පරිපාලන නොවන කාර්යමණ්ඩලය සහ පරිපාලන කාර්යමණ්ඩලය ඇතුළත්ය. මෙම උප ප්‍රභේද දෙකෙහි විස්තර පහත දක්වා ඇත.

### පරිපාලනමය නොවන අනධ්‍යයන කාර්යමණ්ඩලය

තාක්ෂණික නිලධාරීන් හැර අන් සියලුම ලිපිකරු හා ආශ්‍රිත ශ්‍රේණිවල සේවාවන් ලබා ගන්නා ලද්දේ පසුව අනුයුක්ත පදනමින් මෙහෙයුම් සහකාරවරුන් වශයෙන් බඳවා ගනු ලැබූ පුහුණුලාභීන්ගෙනි. මෙම මෙහෙයුම් සහකාරවරු පරිගණක ආශ්‍රිත කාර්යයන්, ලිපිකරු කටයුතු, මෙහෙයුම් කාර්යයන් සහ ලේකම් කාර්යයන් ඇතුළු කාර්යයන් රාශියක් ඉටු කරති. අප විශ්වවිද්‍යාලයේ පරිපාලනය මෙහෙයුම් සාර්ථකත්වය ඉලක්ක කරමින් මෙහෙයවනු ලබන අතර මෙහෙයුම් සහකාරවරු සිය කුසලතා ප්‍රදර්ශනය කර ඇති අතර, අපගේ ක්‍රමෝපායෙහි සාර්ථකත්වය ඔප්පු කොට ඇත.

ස්ථිර කාර්යමණ්ඩල තනතුරු පිරවීමේ ප්‍රයත්නයක් වශයෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ දීර්ඝ කාලයක් සේවය කළ මෙහෙයුම් සහකාරවරුන් 8 දෙනකු පරිගණක ව්‍යාවහාරික සහකාරවරුන් වශයෙන් පත් කරන ලදි. එසේ පත් කරන ලද පරිගණක ව්‍යාවහාරික සහකාරවරුන් අට දෙනා අතරින් 6 දෙනෙක් 2010 වර්ෂය මුළුල්ලේම අඛණ්ඩව සේවයේ සිටියහ. තවද, එක් මෙහෙයුම් සහකාරවරයකු සරප් වශයෙන් ස්ථිර ලෙස පත් කරන ලද අතර තවත් එක් අයකු තාක්ෂණික නිලධාරිවරයකු වශයෙන් පත් කරන ලදි. ගබඩා භාරකරු තනතුරද ස්ථිරවම පුරවන ලදි. සියලුම පත්වීම් ලාභීහු ඌව පළාතේ අය වන අතර, විශ්වවිද්‍යාලයට ආසන්නයේ පදිංචිව සිටිති.

අනධ්‍යයන සහ පරිපාලනමය නොවන කාර්යමණ්ඩලයේ සියලු සාමාජිකයින්ගේ ප්‍රභේද හා සංඛ්‍යාවන් පහත දක්වා ඇත.

| ප්‍රභේදය | සේවක සංඛ්‍යාව |
|---|---|
| තාක්ෂණික නිලධාරී | 02 |
| පරිගණක ව්‍යාවහාරික සහකාරවරු | 06 |
| මෙහෙයුම් සහකාරවරු (පැවරුම් පදනමින්) | 34 |
| ගබඩා භාරකරු | 01 |
| සරප් | 01 |

එයට අතිරේකව උපශාලාධිපතිවරුන් දෙදෙනකුගේ සේවය බාහිර සේවාදායකයකුගෙන් ලබා ගන්නා ලදී.

## පරිපාලන කාර්යමණ්ඩලය

මූල්‍යාධිකාරී, ප්‍රධාන ආරක්ෂක නිලධාරී සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු වී පැවතුණි. 2010 වර්ෂය තුළ පරිපාලන කාර්යමණ්ඩලයේ සේවය කළ එක් එක් ප්‍රභේදයේ සේවක සංඛ්‍යාවන් පහත පරිදි වේ.

| සේවක ප්‍රභේදය | සේවක සංඛ්‍යාව |
|---|---|
| ලේඛකාධිකාරී | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 05 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | 04 |
| ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක | 01 |
| විශ්වවිද්‍යාලයීය වෛද්‍ය නිලධාරී | 01 (කොන්ත්‍රාත් පදනමින්) |

සියළු පරිපාලන කාර්යමණ්ඩල සාමාජිකයෝ මෙහෙයුම් සාර්ථකත්වය අත් කර දීම කෙරෙහි දිශාභිමුඛව සිටිති. ඒ අනුව ලේඛකාධිකාරීවරයා ප්‍රධාන මෙහෙයුම් නිලධාරී වශයෙන්ද, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරු මෙහෙයුම් කළමනාකාරවරුන් වශයෙන්ද, මූල්‍යාධිකාරීවරයා ප්‍රධාන මූල්‍ය නිලධාරි වශයෙන්ද ක්‍රියා කරති. මෙම ක්‍රමෝපාය ආයතනික ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් සාර්ථකත්වය ලබා දෙයි.

2010 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ පරිපාලන කාර්යමණ්ඩලයේ සාමාජිකයින්ගේ නම්, සුදුසුකම් හා තනතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| ලේඛකාධිකාරී (ප්‍රධාන මෙහෙයුම් නිලධාරී) | නිල්මිණී දියබෙදනගේ මිය, බී.කොම්. (කොළඹ), රාජ්‍ය පාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ), එම්.පී.ඒ. (ශ්‍රී ජයවර්ධනපුර), (සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටියාය.) |

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරු | ආර්.වී.එස්.පී. රාජපක්ෂ මහතා, බී.බී.ඒ. (රුහුණ) |
| | එස්. අනූෂා මිය, බී.එස්.සී. (යාපනය) මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (අයි.පී.එම්.) |
| | ඒ.ජේ.එම්.ඩී.එන්.බී. නාවල මහතා, බී.එස්.සී. (කොළඹ), ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (එන්.අයි.බී.එම්) |
| | අයි.එල්. තස්ලීන් මහතා, බී.බී.ඒ. (ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය) |
| | එස්. කුමාරු මිය, බී.ඒ. (යාපනය), පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (යාපනය) |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | ගාමිණී ලියනගේ මහතා, බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (රජරට) / (වැඩ බලන මූල්‍යාධිකාරී හා ප්‍රධාන මූල්‍ය නිලධාරී) |
| | ජී.එස්.කේ. රත්නායක මහතා, බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර), කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (රජරට) |
| | එස්.එම්.විතාන ආරච්චි මිය, බී.බී.එම්. (කැලණිය) |
| | ඒ.අයි.සමරහේවා මහතා, බී.එස්.සී. (රජරට) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පේරාදෙණිය) |
| ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක | ඕ.කේ.එස්.පී. ඕවිටිගල මහතා, බී.කොම්. (ශ්‍රී ජයවර්ධනපුර), පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (වයඹ) |
| වෛද්‍ය නිලධාරී | වෛද්‍ය එච්.එම්.එම්. ජිනසේන, එම්.බී.බී.එස්. (කොළඹ) |
| ව්‍යාපෘති කළමනාකාර | එස්.වී ඒ. පියදාස මහතා, ඉංජිනේරු, ශ්‍රී ලංකා පරිපාලන සේවාව II ශ්‍රේණිය |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | පුරප්පාඩු වී පවතී. |

## 9. පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන

**2010** වර්ෂයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ, නව නිපැයුම් සහ ප්‍රකාශන පහත දැක්වේ.

| විෂයය | ප්‍රකාශයට පත් කරන ලද | වාණිජකරණය කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| **පර්යේෂණ අධ්‍යයන සංඛ්‍යාව** | 69 | - | 69 |
| **නව නිපැයුම් සංඛ්‍යාව** | 10 | - | 10 |
| **වාර සඟරා සංඛ්‍යාව** | - | - | - |
| **ග්‍රන්ථ සංඛ්‍යාව** | - | - | - |
| **ලිපි සංඛ්‍යාව** | - | - | - |
| **එකතුව** | 79 | - | 79 |

## 9.1 පර්යේෂණ

### 9.1.1 සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය

සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය යටතේ 2010 වර්ෂය තුළ පහත සඳහන් පර්යේෂණ ප්‍රකාශන ඉදිරිපත් කරන ලදි.

1. ජේ. ස්වර්ණපාලි, එච්.එස්. ජයවර්ධන සහ **ජී. චන්ද්‍රසේන** (2010). කෝවක්කා (කොක්සිනියා ග්‍රාන්ඩිස්) භාවිතා කරමින් සහල් පදනම් කර ගත් විස්කෝතු වර්ගයක් සංවර්ධනය කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

2. එම්.ටී.කේ. දෙල්පච්ත්‍ර, ඒ.ඩී.ඩී. රෝෂිකා සහ **ජී. චන්ද්‍රසේන** (2010) විරංජනය කරන ලද ඉඟුරු (සිංගිබර් ඔෆිසිනාලි) වල ගුණාත්මකතාව සඳහා දෙහි සාන්ද්‍රණයේ සහ පොඟවන කාලය ඇති කරන බලපෑම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

3. ජී.ඩී.එන්. අමාලි සහ **ජී. චන්ද්‍රසේන** (2010) බයිඑතනෝල් නිෂ්පාදනය සඳහා දේශීය වශයෙන් ඇති පිෂ්ඨමය නිෂ්පාදන ශර්කරීකරණය සඳහා යීස්ට් වෙන් කර ගැනීම සහ ඇමිලෝවිච්ඡේද ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

4. ටී.ජේ.එච්. ගමගේ, එස්.බී. නවරත්න සහ **ජී. චන්ද්‍රසේන** (2010) ක්‍රියාකාරිත්ව ගුණද සමගින් කුරුඳු (සිනමෝමම් වේරුම්) පත්‍ර සාරය භාවිතා කරමින් පාන් මදයේ ව්‍යුහය වැඩි දියුණු කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

5. එච්.ඒ.එස්.එල්. ජයසිංහ, **පී.ඊ. කාලියදාස** සහ ඩී.ඒ. ශිරානි (2010) ලිලි (ලිලියම් ලොන්ගිෆෝලියම්) ශාකයේ විපර්ය වූ කිණකයෙන් පැලැටි පුනර්ජනනය සඳහා වූ මාධ්‍ය කාර්යාවලිය සංවර්ධනය කිරීම සහ උත්තේජිත ලද විපර්යාසය පිළිබඳ අධ්‍යයනය. ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ පුෂ්පරෝපන පර්යේෂණය පිළිබඳ ජාතික විද්වත් සමුළුවේ සැසිය.

6. ඩබ්ලියු.ඒ.එන්.ටී. ද සිල්වා, **පී.ඊ. කාලියදාස** සහ ඩී.ඒ. ශිරානි (2010) ජිප්සෝෆිලා පැනිකියුලාටා (බේබිස් බ්‍රෙත්) නල තුළ වර්ධනය, මුල් ඇදීම සහ පරිසරයට හුරු වීම පිළිබඳ අධ්‍යයනය ශ්‍රී ලංකාවේ

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ පුෂ්පරෝපන පර්යේෂණය පිළිබඳ ජාතික විද්වත් සමුළුවේ සැසිය.

7. එස්.කේ.එම්.එම්. වීරසිංහ, **පී.ඊ. කාලියදාස,** එච්.එම්.අයි. හේරත් සහ එන්.එස්. විතානගේ (2010) ගර්බරා නමැති ඩේසි වර්ගයේ (ගර්බරා ජැමිසෝනියායි) විවිධ ජාන ප්‍රභේදවල නල තුළ බෝ කිරීම පිළිබඳ බහිර් රෝපන මූලාශ්‍රයේ සහ හෝමෝන සංයෝජනවල බලපෑම. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

8. ඩබ්ලියු.එච්.එන්. සිල්වා සහ **පී.ඊ. කාලියදාස** (2010) වාණිජමය වගාව සඳහා අමුක්කරා (විතානියා සොම්නිෆෙරා) වර්ධනය පිළිබඳ අධ්‍යයනය, නිවැරදි අස්වනු කැපීමේ අවධිය සහ රසායන සන්සන්දනය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

9. පී.ඩබ්ලියු.එස්.එච්. සරත්චන්ද්‍ර සහ **පී.ඊ. කාලියදාස** (2010) රුධිරයේ ග්ලූකෝස් මට්ටම අඩු කරන පිණිස වල්කොත්තමල්ලි (ස්කෝපරියා ඩුක්ලිස්) ශාකයෙන් ක්ෂණික ශාකසාර තේ කොළ වර්ගයක් සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

10. ආර්.එම්.ඩී.ඩී.එම්. රස්නායක, කේ.එච්. සාරානන්ද සහ **එස්.ආර්.ඩබ්ලියු.එම්.සී.ජේ.කේ. රණවන** (2010) අස්වැන්න නෙලන විවිධ වර්ධන අවධිවල සහ කල් තබා ගන්නා ක්‍රමවල බලපෑම අනුව ලංකා වෙරළුවල ඇස්කෝබික් අම්ල සහ ප්‍රතිඔක්සිකාරක මට්ටම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

11. එස්.එම්.අයි.පී.ජී. බණ්ඩාර, සී.කේ.ඩී. වැල්ලල සහ **එස්.ආර්.ඩබ්ලියු.එම්.සී.ජේ.කේ. රණවන** (2010) පේර (ප්සිඩියම් ගුවායාවා එල්.) භාවිතයට පෙර තබා ගත හැකි කාලය මත විවිධ පසු අස්වනු පිරියම්වල බලපෑම ඇගැයීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

12. ජේ.පී.ටී. උත්පලා, පී. මාලතී, **එස්.ආර්.ඩබ්ලියු.එම්.සී.ජේ.කේ. රණවන** සහ ඩබ්ලියු.ඩී.ජී.පී. නිලන්ති (2010) තායි කංකුං (ඉපෝමෝයියා ඇක්වටිකා) වල බීජාංකුර සහ නටු කැබලි අතර වර්ධන සහ අස්වනු පරාමිතීන් පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

13. ආර්.එම්.එස්.ඩී. රත්නායක, **ආර්.පී.ඩී. ගුණතිලක** සහ කේ.එච්.එස්.කේ. කිත්සිරි (2010) ශ්‍රී ලංකාවේ මහනුවර දිස්ත්‍රික්කය වෙත විශේෂ අවධානය යොමු කරමින්, කුඩා තේ වතු ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර ආහාර සුරක්ෂිතතා රෙගුලාසි පිළිපැදීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

14. ඩී.අයි.පී. ද සිල්වා සහ **ආර්.පී.ඩී. ගුණතිලක** (2010) අපනයන වෙළඳපල තුළ ලංකා කුරුඳු වෙළඳාම සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (ජී.එම්.පී) වල නිශ්චිතතාව සම්බන්ධ තාර්කික පදනමක්. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

15. කේ.එම්.පී. ජීවන්ති, ජේ.ආර්.කේ. අසංක සහ **ආර්.පී.ඩී. ගුණතිලක** (2010) අගය එක් කළ පොල්තෙල් නිපදවනු පිණිස දිසිදි පොල් සකසු ජලයෙන් තෙල් ලබා ගැනීම - ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

16. එන්.එච්.එන්.ටී. නවරත්න, එස්.බී. නවරත්න සහ **සී.පී. අබේසේකර** (2010) සැන්තන් මැලියම්වලට ආදේශකයක් වශයෙන් පළතුරු යුෂවලට දූරියන් (දූරියෝ සිබෙතිනස්) වල බීජයේ

මැලියම් එක් කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

17. පී.ඒ.ටී. ප්‍රනාන්දු, බී.එම්.එස්.කේ. තිලකරත්න, **එම්.ජී.පී.පී. මහින්දරත්න සහ ඒ.ඒ.එම්. සුබෝධිනී** (2010) කෙඳිවලින් පෝෂිත සහල් පදනම් කර ගත් විස්කෝතු සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.




18. එස්.එම්.ටී. බුද්ධිකා, කේ.ඩී.එස්. කිරිවත්තුඩුවගේ සහ **එම්.ජී.පී.පී. මහින්දරත්න** (2010) ශ්‍රී ලංකාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිතැන් පුරුදුවලදී සහල් වල් නාශකවල අසුරනයේ සඳහන් උපදෙස්වලින් බැහැරට යාම විශ්ලේෂණය කිරීමේ ප්‍රත්‍යක්ෂමූලක අධ්‍යයනයක්. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

19. ඩී.බී.එච්. අඹන්වෙල, එස්.එන්. ජයවර්ධන සහ **එල්.එම්.එච්.ආර්. අල්විස්** (2010) ශ්‍රී ලංකාවේ පුළුල් ලෙස වගා කරනු ලබන සහල් ප්‍රභේදවල අදාළ ප්‍රභේදය සහ සංයුක්ත ඒකාක්ෂ ආරම්භයේදී ප්‍රධාන නටුවේ පත්‍ර සංඛ්‍යාව අතර සම්බන්ධය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

20. ඩබ්ලියු.එම්.එච්.පී. වීරසිංහ, කේ.ජී.බී. ඔබේසේකර සහ **ආර්.ඒ.පී.අයි.එස්. ධර්මදාස** (2010) යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කුඩා තේ වතු වගාකරුවන් විසින් යළි වගා කිරීමේ තීරණය ගැනීමට බලපාන සාධක පිළිබඳ විශ්ලේෂණය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

21. පී.ජී.ටී. චාමර, එම්.ජේ. ජයසුන්දර, **එල්.එම්.එච්.ආර්. අල්විස් සහ ඩී.එස්. නාගහතැන්න** (2010) වායු වර්ණලේඛය මගින් ව්‍යුත්පන්නකරණය සහිත තේ තුළ ඇති 2.4 ඩී සහ එම්.සී.පී.ඒ. රසායන ප්‍රමාණය නිර්ණය කිරීමේ ක්‍රමයක් සංවර්ධනය කර ගැනීම ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

22. ඩබ්ලියු.එම්.එස්.යූ.කේ. විජේකෝන්, එස්. ඒකනායක සහ **සී.පී. අබේසේකර** (2010) තිත්ත අඩු තැවරුමක් පිළියෙළ කිරීමෙන් කරවිල (මොමෝඩිකා චැරැන්ටියා) වලට අගය එක් කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

23. ආර්.වී. ප්‍රසන්න, එච්.ඩබ්ලියු. ශ්‍යාමලී සහ **ආර්.ඒ.පී.අයි.එස්. ධර්මදාස** (2010) ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ කුඩා පරිමාණ තේ වවන්නන් මත පොහොර සහනාධාරයේ ඇති ආර්ථික බලපෑම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

24. කේ.ඒ.ටී. කුමාරසිංහ, ඩී.පී. කරුණානන්ද සහ **එල්.එම්.එච්.ආර්. අල්විස්** (2010) තිළිණ නමැති තක්කාලි (සොලානම් ලයිකොපෙර්සිකන්) ප්‍රභේදයේ බීජ නිෂ්පාදනය මත බහිර්ජනා වර්ධන නියාමකයන්හි ඵලය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

25. ආර්.පී.එස්.එච්.රත්නායක, කේ.එච්. සාරානන්ද සහ **සී.පී. අබේසේකර** (2010) පොටෑසියම් (කේ.සී. 1) යෙදීමෙන් පසු-අස්වනු රෝග තත්ත්වය මත සහ ඉදුණු පැපොල් (කැරිකා පැපායා එල්.)

වල පළතුරු ගුණය මත ඇති වන ඵලය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

26. කේ.පී.ටී. ප්‍රේමදාස, කේ.ජී.බී. ඔබේසේකර සහ **ආර්.ඒ.පී.අයි.එස්. ධර්මදාස** (2010) කළුතර දිස්ත්‍රික්කය පාදක කර ගත් කුඩා තේ වතු අංශය සඳහා සාධාරණ මිල සූත්‍රයක් සම්බන්ධයෙන් අමු තේ කොළවල ගුණාත්මකතාවයට බලපාන හඳුනා ගැනීමේ සාධක සහ මිළ දිරිගැන්මේ බලපෑම පිළිබඳ අධ්‍යයනය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

27. එස්.ජී.එන්.කේ. සුබසිංහ, **එම්.ජී.පී.පී. මහින්දරත්න** සහ ඒ.පී.පී. දිස්නා (2010) මාතලේ දිස්ත්‍රික්කයේ සාම්ප්‍රදායික මෙන්ම කාබනික ගම්මිරිස් නිෂ්පාදන ක්‍රමවල වියදම සහ ප්‍රතිලාභ සන්සන්දනය කරනු පිණිස වූ ප්‍රත්‍යක්ෂමූලක අධ්‍යයනයක්. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

28. **ඊ.ඩී.එන්. එස්. අබේරත්න, ඩී.සී. මුදන්නායක** සහ එච්.ඩබ්ලියු. සිරිල් (2010) සහල් පිටි සමග කුකුළු ගොපුර සහ අක්මාව මිශ්‍ර කිරීමෙන් පපඩම් වර්ගයක් සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

29.. පී.බී.ඒ.අයි.කේ. බුළුමුල්ල, පී. සිල්වා සහ එච්.ජියැන්ලින්. ශ්‍රී ලංකාවේ දේශීය කුකුළන් සහ ලංකා වළි කුකුළා (ගැල්ලුස් ලාෆායෙටි) තුළ ඇති ටී.එල්.ආර්. 7 ජානයේ ජානමය විවිධත්වය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ  පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික සම්මේලනයේ නිබන්ධ සැසිය.

30. ඩී.සී. කරුණාරත්න, **ඒ.එම්.එන්.එල්. අබේසිංහ, ඩී.සී. මුදන්නායක** සහ කේ.එෆ්.එස්.ටී. සිල්වා (2010) උපරිම සංවේදන ඉන්ද්‍රීය බද්ධ ගුණ සහිත පිසීමට සූදානම් පදම් කළ සුමුදු පනියර් කේජු සඳහා ප්‍රශස්තතම සිට්‍රික් අම්ල සාන්ද්‍රණය සහ තෙරපුම් බර නිර්ණය කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

31. වයි.ජී.සී. ඉන්දික, **ඩී.සී. මුදන්නායක, ඒ.එම්.එන්.එල්. අබේසිංහ,** ජේ.කේ. විදානාරච්චි සහ ඩී.ඒ. එම්. අර්සකුලරත්න. මිදුණු යෝගට් මධ්‍යය සහ දෙහි (සිට්‍රස් ඕරන්ටිෆෝලියා) ලෙල්ල සහිත, නටුවක (පැතලි අයිස් පලම් කෝට්ටක) ගැසූ අච්චුවේ සකස් කළ ශර්බට් පලමක් සංවර්ධනය කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීම පිළිබඳ පර්යේෂණ විද්වත් සමුළුවේ සැසිය.

32. අයි.එම්.වී.ඊ. ඉලංකෝන්, **ඩී.සී. මුදන්නායක, ඒ.එම්.එන්.එල්. අබේසිංහ,** කේ. ජයරත්න සහ කේ.එෆ්.එස්.ටී. සිල්වා. යොදය ඉවත් කළ කිරි පිටි, සණීකරණය කළ පොල් (කොකෝස් නියුසිෆෙරා) කිරි සහ කිතුල් (කැර්යෝටා යුරෙන්ස්) පැණි මිශ්‍ර කොට දීකිරි පුඩිමක් සංවර්ධනය කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

33. බී.එම්.යූ. බස්නායක, **ඩී.සී. මුදන්නායක, ඒ.එම්.එන්.එල්. අබේසිංහ,** සී.පී. සමරසේකර **සහ** කේ.එෆ්.එස්.ටී. සිල්වා. අයිස්ක්‍රීම්වල දිය වීමට ඇති ප්‍රතිරෝධය මත අතිරේකව තබා තැබූ සහ ගබඩා

කර තැබූ උෂ්ණත්වයේ ඵලය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

34. එම්.කේ. රණසිංහ, **ඩී.සී. මුදන්නායක, ඒ.එම්.එන්.එල්. අබේසිංහ,** එල්. රූපසිංහ සහ ජේ.කේ. විදානාරච්චි. සූප චොක්ලට් සිරප් රැළි යෙදූ අගය එක් කළ යෝගට් වර්ගයක් සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

35. එස්.එම්.ඒ.බී. සමරසිංහ, **ඩී.සී. මුදන්නායක, ඒ.එම්.එන්.එල්. අබේසිංහ,** කේ.එෆ්.එස්.ටී. සිල්වා සහ කේ.ඊ. උදයතිලක. දිගන පිහිටි සීමාසහිත මිල්කෝ (පෞද්ගලික) සමාගමේ යෝගට් නිෂ්පාදන පෙත සඳහා 'උපද්‍රව විශ්ලේෂණ සහ තීරණාත්මක පාලන සංලක්ෂ (එච්.ඒ.සී.සී.පී) සැලැස්මක්' සංවර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

36. ටී.ජී.ඒ.එස්. සංජීව, **ඩී.සී. මුදන්නායක, ඒ.එම්.එන්.එල්. අබේසිංහ,** ජේ.එන්. ධනසේකර සහ ජේ.කේ. විදානාරච්චි. සංග්‍රහ කිරීමට සූදානම් පොලිස්ටිරීන් කෝප්පවල ඇසුරූ ස්ථර සහිත ජෙලි කස්ටඩ් වර්ගයක් සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

37. ජී.ඩී.එම්. තිලකරත්න, **ඊ.ඩී.එන්.එස්. අබේරත්න, එස්.සී. ජයමාන්න** සහ එස්.එච්. ජයසේන. සුදුසු දේශීයව ඇති පිරවුමක්, සහල් (ඔරයිසා සැටිවා), කුරක්කන් (එලියුසීන් කොරාකානා) පිටි සහ සෝයා (ග්ලයිසීන් මැක්ස්) පිටි සමගින් තලපත් මාළු සහ බලමාලු සංයෝග කොට මාළු තලප බැදුමක් සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

38. යූ.එස්.ආර්.ටී.ඒ. බණ්ඩාර, **ඊ.ඩී.එන්.එස්. අබේරත්න** සහ එච්.ඩබ්ලියු. සිරිල්. කුකුළු මස්, අක්මාව සහ ගොජුර සහ පිරවුමක් වශයෙන් දේශීයව ඇති ධාන්‍ය වර්ගයක් භාවිතා කරමින් බර්ගර් වර්ගයක් සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

39. කේ.එම්.පී.ඒ. පියසේන, **ඊ.ඩී.එන්.එස්. අබේරත්න**, ඩී.කේ.ඩී.ඩී. ජයසේන, සී. බොරළුව සහ එච්.ඩබ්ලියු. සිරිල්. සීමාසහිත ගිල්ස් ෆුඩ්ස් (පෞද්ගලික) සමාගමේ සැකසූ මාංශ නිෂ්පාදන පෙත සඳහා 'උපද්‍රව විශ්ලේෂණ සහ තීරණාත්මක පාලන සංලක්ෂ (එච්.ඒ.සී.සී.පී) සැලැස්මක්' සංවර්ධනය කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

40. කේ. කැනෝජන්, එම්.ඩී.සී.ඒ. පෙරේරා, **ඊ.ඩී.එන්.එස්. අබේරත්න** සහ **එස්.සී. ජයමාන්න.** ආසියානු නිල් පිහිනුම් කකුළුවාගේ හුමාලයෙන් තැම්බූ මාංශ සඳහා 'උපද්‍රව විශ්ලේෂණ සහ තීරණාත්මක පාලන සංලක්ෂ (එච්.ඒ.සී.සී.පී) සැලැස්මක්'සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

41. එච්.ඩී.එස්.ජේ. දිසානායක, **ඩී.කේ.ඩී.ඩී. ජයසේන,** එස්.ඩී.බී. සමයමන්ත්‍රී සහ එච්.ඩබ්ලියු. සිරිල්. සුදුසු මේද ආදේශකයකින් සමන්විත අඩු මේද කුකුළු මස් බෝල (චිකන් මීට් බෝල්ස්) වර්ගයක්

සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

42. පී. පද්මනාදන්, **ඩී.කේ.ඩී.ඩී. ජයසේන,** එන්.එම්.එන්. නම්බපාන සහ ජී. වීරසූරිය. කැපුම් බර මත කොබ්ස් සහ හයිබ්‍රෝ වර්ගයන්හි ඝාතන වයස සහ ස්ත්‍රී පුරුෂ බව ඇති කරන ඵලය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

43. එස්.ඕ.එම්.ආර්. ඔසෙන්, **එස්.සී. ජයමාන්න** සහ ජ්.ආර්. මුදලිගේ. පනාවලිගා (බෙලොන්ටිකා සිංනාටා) නමැති දේශීය ආවේණික මත්ස්‍ය වර්ගය සඳහා අභිජනන තාක්ෂණයක් සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

44. ඩබ්ලියු.එම්.එස්.ජ්. ප්‍රියදර්ශන, **එස්.සී. ජයමාන්න** සහ ඩබ්ලියු වික්‍රමසිංහ. තිලාපියාගේ සම භාවිතා කරමින් සම් වර්ගයක් සංවර්ධනය කර ගැනීම සහ ක්රෝමියම් රහිත සම් නිපදවනු පිණිස ශාකමය සහ ඇලුමිනියම් පදම් ද්‍රව්‍ය භාවිතා කරමින් මත්ස්‍ය සම් පදම් කිරීම සඳහා ක්‍රමයක් සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

45. එම්.වයි.එෆ්. වනිගසේකර, එම්.එච්.එස්. ආරියරත්න, එච්.එම්.පී. කිත්සිරි සහ **එස්.සී. ජයමාන්න**. ගප්පි නමැති සුරතල් මත්ස්‍ය වර්ගය ඇති කිරීම සඳහා අඩු වියදම් මත්ස්‍ය ආහාර වර්ගයක් සංවර්ධනය කර ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

46. එම්.වයි.එෆ්. නාතියා, පී.කේ.එම්. විජේගුණවර්ධන, **පී.බී.ජ්.අයි.කේ. බුළුමුල්ල සහ එස්.සී. ජයමාන්න**. කුණිස්සන්ගේ බිත්තර රකින මධ්‍යස්ථාන සඳහා රකින සත්ව සම්පතක් වශයෙන් පිනේයස් මොනෝඩොන් යෝධ රතු ඉස්සා වෙසෙන සුදු පුල්ලි රෝගකාරක වයිරසයෙන් තොර ස්ථාන හඳුනා ගැනීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

47. එස්. නිරූබා, ඊ.ඩී.එන්.එස්. ආරියරත්න, **එස්.සී. ජයමාන්න,** එස්.එච්. ජයසේන. තලපත් මත්ස්‍යයාගේ මූලික රසදිය ප්‍රමාණය අඩු කරනු පිණිස අඩු වටිණාකමක් ඇති මත්ස්‍ය වර්ග වන බැරමුන්ඩි (ලටෙස් කැල්කැරිෆර්), ඉන්දියානු කාප්පයා (කැට්ලා කැට්ලා) හා ගල්මාලු (රෙඩ් ස්නැපර් - ලුට්යානුස් කැම්පෙචානුස්) සහ අල බෝග වන අර්තාපල් (සොලානුම් ටියුබරෝසුම්), බතල (ඉපොමොයියා බැටාටාස්) හා ඉන්නල (සොලෙනෝස්ටෙමොන් රෝටුන්ඩිෆෝලියුස්) අන්තර්ග්‍රහණය කිරීමෙන් තලපත් මාලුවල අපනයන ගුණාත්මකතාව වර්ධනය කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

48. කේ.කේ.එම්.එම්. විමලකීර්ති, පී.එච්. ගිනිගද්දරගේ, කේ.ඩබ්ලියු.එස්. ආරියවංශ, ජී.ජේ. ගනේගම ආරච්චි සහ **එස්.සී. ජයමාන්න**, කෙලවල්ලා බෝට්ටු තුළ ශීත කිරීම සඳහා අසුරා තැබීමේදී අයිස්වලට සීනි එකතු කිරීම මගින් ටී.වී.බී. - එන්. අන්තර්ගතය, ක්ෂුද්‍ර ජීව වර්ධනය, පී.එච්. අගය සහ හිස්ටමින් ඇතිවීම මත ඇති කෙරෙන ඵලය විමර්ශනය කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

49. අයි.කේ.ඩී.සී.බී. ඒකනායක, **එන්.එම්.එන්. නම්බපාන, ඩී.කේ.ඩී.ඩී. ජයසේන**, ඩී.ඒ. සතරසිංහ සහ කේ. සමරසිංහ. පක්ෂි කණ්ඩායමේ වයස සහ බිත්තර ගබඩා කර තිබෙන කාලය මගින් බ්‍රොයිලර් පූර්වජනක (දෙමව්පියන්ගේද දෙමව්පියන්ගේ) බිත්තරවලට රක්කා පැටව් ලබා ගැනීමට ඇති හැකියාව සහ දෘෂ්‍ය සරුභාවය මත ඇති කෙරෙන ඵලය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

50. එම්.පි. වෙත්තසිංහ, ඊ්.ඩී.එන්.එස්. අබේරත්න සහ බී. කරුණාරත්න. බල (තුන්නුස් ඇල්බකාරුස්) මාළුන්ගේ වාසභූමිය සහ විශාලත්වය වෙනස් වීම අනුව ඔවුන් තුළ ඇති රසදිය මට්ටම විමර්ශනය කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

51. ඒ.එම්.ආර්.එස්. අමරසේකර, **එන්.එම්.එන්. නම්බපාන, ඩී.කේ.ඩී.ඩී. ජයසේන** සහ ජී.ඒ.පී. ගනේගොඩ. ඌෂ්ණ කාලවලදී, පාරිසරික වශයෙන් පාලනය කරන ලද බ්‍රොයිලර් නිවාසවල බ්‍රොයිලර් කුකුළන්ගේ සජීව කාර්යසාධනය සහ පාරිසරික සාධක පිළිබඳ නිරීක්ෂණ. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

52. ටී.එස්.ආර්. ප්‍රනාන්දු, ආර්.පී.වී.ජේ. රාජපක්ෂ, **පී.බී.ඒ.අයි.කේ. බුළුමුල්ල සහ කේ. විජේසුන්දර.** බදුල්ල දිස්ත්‍රික්කයේ ගවයින් අතර ආමාශීය ආන්ත්‍රික පරපෝෂිතයිනේග් සුලභතාව. (ක්‍රිප්ටෝස්පොරිඩියම් විශේෂයන් වෙත විශේෂ අවධානයද සහිතවය.) ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

53. කේ.එම්.කේ.ආර්. කුමාරගම, ආර්.පී.වී.ජේ. රාජපක්ෂ, **ඒ.එම්. සමරවීර සහ කේ.ඒ. විජේසුන්දර,** මහබේරියතැන්න ගොවිපලේ ගව සහ එළු ඒකකවල නෙමටෝඩ් සහ අයිමරියා විශේෂවල ආමාශීය ආන්ත්‍රික පරපෝෂිතවේදය පිළිබඳ අධ්‍යයනයක්. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

54. ටී. මදියලගන්, **පී.බී.ඒ.අයි.කේ. බුළුමුල්ල** සහ ඩී.වී.එස්.ඩී.එස්. ගමගේ. කුණ්ඩසාල, කරඳගොල්ලේ මධ්‍යම කුකුළු පර්යේෂණ ගොවිපලෙහි, දේශීය ගම්කුකුළු (කුඩා, මධ්‍යම සහ බර) ප්‍රභේද තුනෙහි වර්ධනය සහ කාර්යසාධනය පිළිබඳ අධ්‍යයනය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

55. ඒ.එල්.එම්. රිෆ්කි, **ඒ.එම්. සමරවීර**, ජේ.වී.එල්.සී. ජයසිංහ සහ එම්.බී.පී.කේ.ඒ. මහීපාල. සිද්ධි අධ්‍යයනය: නුවරඑළිය දිස්ත්‍රික්කයේ සීමාසහිත ස්විස් චීස් (පෞද්ගලික) සමාගමේ කොන්ත්‍රාත් ගොවීන්ගේ කිරි නිෂ්පාදනයට බලපාන සාධක. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

56. ඩබ්ලියු.එල්.යූ. විජේසේකර, ඊ්.ඩී.එන්.එස්. අබේරත්න, ජී.ඒ.පී. ගනේගොඩ සහ කේ. සමරසිංහ. වඩාත් පිරිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් හරහා කුකුළු ආහාර සැකසීමේදී නාස්තිය අවම කිරීම. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

57. එස්. විනෝද්සංකර්, ඩබ්ලියු. වික්‍රමසිංහ, ඒ.එම්. සමරවීර සහ එච්.ඩබ්ලියු. සිරිල්. සම් කර්මාන්තයේ ඉවත දමන ද්‍රව්‍යවලින් ලැබෙන සත්ව තෙල්වල ප්‍රමාණය සහ යම් භෞතරසායනික ගුණ පිළිබඳ විශ්ලේෂණය. ශ්‍රී ලංකාවේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීමේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ සැසිය.

**තවද මෙම වර්ෂය තුළ පහත දැක්වෙන පර්යේෂණ සිදු කෙරෙමින් පැවතුණි.**

**පී.ඊ. කාලියදාස,** වාණිජ වගාව සඳහා අමුක්කරා (විතානියා සොම්නිෆෙරා එල්.) වල නිවැරදි අස්වනු නෙලීමේ අවධිය, රසායන අන්තර්ගතය, සහ නල තුළ සහ බාහිරව වර්ධනය කරන ලද ශාකයන් අතර සන්සන්දනය.

**පී.ඊ. කාලියදාස,** රුධිර ග්ලූකෝස් මට්ටම් අඩු කරනු පිණිස වල්කොත්තමල්ලි (ස්කෝපරියා ඩල්සිස්) වලින් ක්ෂණික ශාකසාර තේ වර්ගයක් සංවර්ධනය කර ගැනීම.

ඉහත සඳහන් ප්‍රකාශයට පත් කරන ලද පර්යේෂණයන්ට අමතරව, පශු සම්පත් නිෂ්පාදනය සහ ජලජ සම්පත් වෙතින් ආදායම වැඩි කිරීමේ අරමුණින් යුතු පර්යේෂණද සිදු කෙරේ. ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘති 28 ක් සිදු කරන ලද අතර, ඒවායේ සොයා ගැනීම් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේදී ඉදිරිපත් කරන ලදි.

## 9.1.2 විද්‍යා සහ තාක්ෂණවේද පීඨය

පහත දැක්වෙන පර්යේෂණ අධ්‍යයනයන් සම්පූර්ණ කරන ලද අතර, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුවේ විවෘත සැසියේදී ඉදිරිපත් කරන ලදී.

1. **ජී.ඩී.ඩබ්ලියු.එම්. ආරියරත්න** සහ ඒ.එස්. කරුණානන්ද. 2010. කෘත්‍රිම ස්නායුක ජාලය භාවිතා කරමින්, දන්ත චිකිත්සාව තුළ මස්තිස්කමානක විශ්ලේෂණය ස්වයංක්‍රීය කිරීම. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුව.

2. එස්.එම්.වී. සකලසූරිය සහ කේ.පී.එස්.ඩී. කුමාරපතිරණ. 2010. පොලිස් අපරාධ දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ විද්වත් සමුළුව.

## 9.1.3 කළමනාකරණ පීඨය

කළමනාකරණ පීඨයේ පහත දැක්වෙන කාර්යමණ්ඩල සාමාජිකයෝ 2010 වර්ෂයේදී පහත සඳහන් ප්‍රකාශනයන් ඉදිරිපත් කළහ.

1. **ආර්.ඩී.එන්. පල්ලියගේ මහතා,** ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයේ මූලාශ්‍රයක් වශයෙන් සමස්ත සාධක නිෂ්පාදන ඵලදායිතාව, 2010 ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ තොරතුරු සහ කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව.

2. **ආර්.ඩී.එන්. පල්ලියගේ මහතා,** ශ්‍රී ලංකාවේ පෞද්ගලික ඉතිරි කිරීම් නිශ්චය කරන සාධක විශ්ලේෂණය කිරීම, 2010 ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ වාර්ෂික විද්වත් සමුළුව.

3. **ආර්.ඩී.එන්. පල්ලියගේ මහතා,** විරැකියාව සහ එහි මෑතකාලීන ප්‍රවණතාවය, 2010 වයඹ කළමනාකරණ සඟරාව, ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලය.

4. **ආර්.ඩී.එන්. පල්ලියගේ මහතා,** ශ්‍රී ලංකාවේ යුධ පශ්චිම වාතාවරණය තුළ ආර්ථික වර්ධනයේ මෙවලමක් වශයෙන් මානව ප්‍රාග්ධනය, 2010 ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපයේ පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර විද්වත් සමුළුව.

5. **ජයරංජනී සුදා මිය,** "මඩකලපුව දිස්ත්‍රික්කයේ යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශය තුළ පැණි එකතු කිරීමේදී අලෙවිකරණ ක්‍රමෝපායන් යොදා ගැනීම පිළිබඳ අධ්‍යයනයක්, ආර්.ජේ. සුදා, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පිළිබඳ වාර්ෂික විද්වත් සමුළුව.

6. **ජයරංජනී සුදා මිය,** "මඩකලපුව දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය නොවන සංවිධානයන්හි පුහුණු කිරීම්වලට සහභාගි වීමට සේවකයින් පොළඹවන පුද්ගලික හා වාතාවරණමය සාධක පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක්, ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ කෘතිය. එම කෘතිය 2010 වර්ෂයේ පර්යේෂණ පිළිබඳ වවුනියා වාර්ෂික විද්වත් සැසියේදී ප්‍රකාශයට පත් කරන ලදි.

7. ආචාර්ය එච්.ආර්. නිශාදිනී පීරිස්. බෞද්ධ පෞරුෂත්ව ප්‍රභේද සිද්ධාන්තයේ මනෝ විද්‍යාත්මක පැතිකඩ, බෞද්ධ අධ්‍යයනයනය පිළිබඳ 4 වන ජාත්‍යන්තර සමුළුව.

8. "ජේ.පී.ආර්.සී. **රණසිංහ මහතා,** ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා සංචාරක කර්මාන්තයේ ඇති වැදගත්කම" කළමනාකරණය සහ අලෙවිකරණය පිළිබඳ ජේ.එම්. ජාත්‍යන්තර සඟරාව. (ISSN 2230-701X) 2011.

9. **එම්. රුබවදනන් මහතා,** "තිරුක්කුරල් තුළ ඇති සාමාජීය සාරධර්ම" - ආගමික කටයුතු අමාත්‍යාංශය, මොරල් අප්-ලිමිටඩ් සහ හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදුව සැප්තැම්බර් 23 වන දින සිට 25 වන දින දක්වා කොළඹ දී පැවැත්වුණු ශංගම්-පශ්චිම යුගය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදි ඉදිරිපත් කරන ලදී.

10. **එම්. රුබවදනන් මහතා,** උඩරට කථන දෙමළ බස තුළ සිංහල බසෙහි ආභාෂය - 2010 ජුනි 23 වන දින සිට 27 වන දින දක්වා ඉන්දියාවේ කොයින්බතුර්හි පැවති 2010 ලෝක සම්භාව්‍ය දෙමළ සමුළුවේදී ඉදිරිපත් කරන ලදි.

11. **මදූරංග කුලතුංග මහතා,** "පාරිභෝගික සබඳතා කළමනාකරණය - පාරිභෝගික සතුට සඳහා මෙවලමක් ලෙස - ශ්‍රී ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ රෙදිපිළි සාප්පුවල අලෙවි සේවක චර්යාව කෙරෙහි විශේෂ අවධානයද සහිතවය.

## 9.2 නව නිපැයුම්

මෙම විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් විසින් 2010 වර්ෂය තුළ පහත සඳහන් නව නිපැයුම් සිදු කරන ලදි.

- **විද්‍යුත්-යාන්ත්‍රික මැඩියා - පැනිය හැකි රොබෝවෙක්**
  විද්‍යා සහ තාක්ෂණවේද උපාධි වැඩසටහනේ යාන්ත්‍ර විද්‍යුතය පිළිබඳ විශේෂඥතාවය ලබා සිටින අවසන් වසරේ ශිෂ්‍යාවක වන ප්‍රියංවදා නිමේෂා විජේසූරිය මෙනවිය විද්‍යුත්-යාන්ත්‍රික මැඩියා නමින් හඳුන්වන පැනිය හැකි යාන්ත්‍රික රොබෝවෙක් සංවර්ධනය කළාය. ඇගේ අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතිය වශයෙන් පැනීමට සමත් යාන්ත්‍රික රොබෝවෙක් තනනු පිණිස එම ව්‍යාපෘතිය සිදු කරන ලදි.

- **තථ්‍ය-කාල දූස්ස්‍රාවිතාමානකයක්**
  විද්‍යා සහ තාක්ෂණවේද උපාධි වැඩසටහනේ ද්‍රව්‍ය විද්‍යාව පිළිබඳ විශේෂඥතාවය ලබා සිටින අවසන් වසරේ ශිෂ්‍යාවක වන පී. සුමුදු දිලීපා දයාරත්න මෙනවිය අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින්, තථ්‍ය-කාල දූස්ස්‍රාවිතාමානකයක් නිර්මාණය කළාය. මෙම දූස්ස්‍රාවිතාමානකය භාවිතා කිරීමට පහසු පාලන ඒකකයක් සහිත අඩු වියදම්, අතේ ගෙන යා හැකි, කර්මාන්තයේ භාවිතා කළ හැකි උපකරණයකි. මෙය නිවිටන තරලවල දූස්ස්‍රාවිතාව මැනීමට භාවිතා කළ හැකිය.

- **යළි ආරෝපනය කළ හැකි විද්‍යුත් කෝෂ (බැටරි) සඳහා ලංකා මිනිරන්**
  විද්‍යා සහ තාක්ෂණවේද උපාධි වැඩසටහනේ ද්‍රව්‍ය විද්‍යාව පිළිබඳ අවසන් වසරේ ශිෂ්‍යාවක වන ඒ.ඒ. කුමුදු ගීතිකා මෙනවිය අවසන් වසරේ පර්යේෂණයක් වශයෙන් 'යළි ආරෝපනය කළ හැකි විද්‍යුත් කෝෂ (බැටරි) යෙදවුම් සඳහා ශ්‍රී ලංකා මිනිරන්' භාවිතය පිළිබඳ පර්යේෂණයක් සිදු කළාය. ලිතියම්-අයන ප්‍රති-ආරෝපිත බැටරි සඳහා මිනිරන් භාවිතා කළ හැකි ඉහළ විභවය පෙන්වා දෙමින්, උචිත අදියරේ පවිත්‍රතාව සහ සැලකිය යුතු විදුලි සන්නායකතාව සහිත ස්වාභාවික මිනිරන් ශ්‍රී ලංකාවෙන් ලබා ගැනීමේ හැකියාව මෙම විමර්ශනවලින් දැක්වුණි.

- **පිසීමට සූදානම් තද පනීර් කේජු**
  අවසන් වසරේ ශිෂ්‍යාවක වන දූලානි චතුරිකා කරුණාරත්න මෙනවිය සිය සත්ව විද්‍යා උපාධි වැඩසටහනේ අවශ්‍යතාවක කොටසක් ඉටු කිරීමක් වශයෙන් පිසීමට සූදානම් තද පනීර් කේජු වර්ගයක් සංවර්ධනය කරනු පිණිස පර්යේෂණයක් සිදු කළාය. චතුරිකා ගව කිරි භාවිතා කරමින් මිරිස් සෝස් (චිලි සෝස්) මාධ්‍යයක් තුළ මෙම පදම් කරන ලද පිසීමට සූදානම් තද පනීර් කේජු වර්ගය සංවර්ධනය කොට ඇත.

- **දොඹ ගෙඩිවලින් ජෛව - ඩීසල්**
  අවසන් වසරේ ශිෂ්‍යාවක වන දූලානි කුරුප්පු මෙනවිය සිය විද්‍යා සහ තාක්ෂණවේද උපාධි වැඩසටහනේ අවශ්‍යතාවක කොටසක් ඉටු කිරීමක් වශයෙන් දොඹ පල වලින් ජෛව-ඩීසල් නිපදවනු පිණිස පර්යේෂණයක් සිදු කළාය. දොඹ (කැලෝෆිලම් ඉනෝෆිලම්) වලින් සිඳ ගත් පිරිසිදු තෛලය ක්ෂාර මගින් උත්ප්‍රේරණය කරන ලද පාර-එස්ටරීකරණයෙන් පසු ජෛව ඩීසල් සාදා ගන්නා ලදී. පිරිසිදු ජෛව ඩීසල් සමග පොසිලමය ඩීසල් මිශ්‍ර කිරීමෙන් ජෛව ඩීසල් සංයෝගය සාදා ගන්නා ලදි.

- **බලවිදුලිය උත්පාදනය සඳහා කාබන් ඉන්ධන කෝෂ**
  අවසන් වසරේ ශිෂ්‍යාවක වන මානෙල් කරුණානායක මෙනවිය විද්‍යා සහ තාක්ෂණවේද උපාධි වැඩසටහනේ ද්‍රව්‍ය විද්‍යාව පිළිබඳ විශේෂ වැඩසටහනේ අවශ්‍යතාවක කොටසක් ඉටු කිරීමක් වශයෙන් විද්‍යුත් රසායනික ශක්ති පරිවර්තනය සඳහා අඩු වියදම් සහ කාර්යක්ෂමතාව වර්ධනය කළ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණයක් සිදු කළාය. මානෙල් කරුණානායක මෙනවිය විද්‍යුත් රසායනික ශක්ති පරිවර්තනය සඳහා අඩු වියදම් සහ කාර්යක්ෂමතාව වර්ධනය කළ ද්‍රව්‍ය සංවර්ධනය කොට ඇත.

- **කාර්යාලීය කටයුතු සඳහා රොබෝවෙක්**

  යාන්ත්‍රි විද්‍යුතය පිළිබඳ විශේෂඥතාවය ලබමින් සිටින අවසන් වසරේ ශිෂ්‍යයකු වන රන්ජන් කුලතුංග මහතා විද්‍යා සහ තාක්ෂණවේද උපාධි වැඩසටහනේ අවශ්‍යතාවන්හි කොටසක් ඉටු කිරීමක් වශයෙන් කාර්යාලයේ සේවය කරනු පිණිස සේවා රොබෝවෙක් සංවර්ධනය කර ඇත.

- **පරිභෝජනය අඩු කරන බුද්ධිමත් ශක්ති මානකයක්**

  යාන්ත්‍රි විද්‍යුතය පිළිබඳ විශේෂඥතාවය ලබමින් සිටින අවසන් වසරේ ශිෂ්‍යයකු වන ජනක බණ්ඩාර ඒකනායක මහතා සිය විද්‍යා සහ තාක්ෂණවේද උපාධි වැඩසටහනේ අවශ්‍යතාවන්හි කොටසක් ඉටු කිරීමක් වශයෙන් ශක්ති පරිභෝජනය සැලකිය යුතු ප්‍රමාණයෙන් අඩු කළ හැකි බුද්ධිමත් ශක්ති මානකයක් සංවර්ධනය කර ඇත.

- **අඩු වියදම් දෘෂ්ටි ත්‍රිමාන ස්කෑනරය (පරීක්ෂකය)**

  යාන්ත්‍රි විද්‍යුතය පිළිබඳ විශේෂඥතාවය ලබමින් සිටින අවසන් වසරේ ශිෂ්‍යයකු වන නලින්ද ඒ.එන්. රණසිංහ මහතා 'පෘෂ්ඨ මත ඇති සරල වස්තු දෘෂ්‍ය කර ගැනීම සඳහා අඩු වියදම් දෘෂ්ටි ත්‍රිමාන ස්කෑනරයක්' නම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ අතර, සිය විද්‍යා සහ තාක්ෂණවේද උපාධි වැඩසටහනේ අවශ්‍යතාවන්හි කොටසක් ඉටු කිරීමක් වශයෙන් සිය පර්යේෂණය පදනම් කර ගෙන එම උපකරණය සංවර්ධනය කළේය. මෙම ස්කෑනරය සරල වස්තු මෙන්ම සංකීර්ණ වස්තුද ප්‍රමාණවත් නිරවද්‍යතාවකින් දෘෂ්‍ය කර ගැනීමෙහි සමත්ය. එය ලේසර් ආලෝකයක් සහ ඩිජිටල් නිශ්චල රූ කැමරාවක් භාවිතා කරමින් සංවර්ධනය කර ගනු ලැබීය.

- **චොක්ලට් සිරප් මිශ්‍රිත, චොක්ලට් යෝගට්**

  සත්ව පාලන විද්‍යා උපාධි පාඨමාලාවේ අවසන් වසරේ ඉගෙනුම ලබමින් සිටින කේෂණි රණසිංහ මෙනවිය විසින් සත්ව පාලන විද්‍යා උපාධි වැඩසටහනේ අවශ්‍යතාවන්හි කොටසක් ඉටු කිරීමක් වශයෙන් චොක්ලට් සිරප් මිශ්‍රිත, අගය එකතු කරන ලද චොක්ලට් යෝගට් වර්ගයක් සංවර්ධනය පිණිස පර්යේෂණයක් සිදු කළාය.

## 10. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| විෂයය | සහභාගි වූ | සම්පූර්ණ කරන ලද | පිරිනමන ලද |
|---|---|---|---|
| පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව | -- | -- | -- |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | -- |
| උපාධි වැඩසටහන් සංඛ්‍යාව | 11 | 05 | -- |
| ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | -- | -- | -- |
| සහතික වැඩසටහන් සංඛ්‍යාව | 06 | -- | -- |
| ප්‍රජා සේවා සම්පාදන වැඩසටහන් සංඛ්‍යාව | 09 | 09 | -- |
| කාර්යමණ්ඩල සංවර්ධන සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංඛ්‍යාව | 18 | 18 | -- |
| එකතුව | 45 | 33 | -- |

### 10.1 පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන

ප්‍රථම පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන වන, කළමනාකරණ පීඨය යටතේ මෙහෙයවන ලද, ආයුජීවගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2010 වර්ෂයේදී සාර්ථකව සම්පූර්ණ කරන ලද්දේ ශ්‍රී ලාංකික උසස් අධ්‍යාපනය තුළ ආයුජීවගණක විද්‍යා ක්ෂේත්‍රය තුළ පශ්චාත් උපාධි අධ්‍යයන්හි නව ප්‍රවණතා ඇති කරමිනි.

### 10.2 උපාධි වැඩසටහන්

2010 වර්ෂයේදී පීඨ 3 ක් යටතේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද උපාධි වැඩසටහන් 11 ක් විය. එක් එක් පීඨය විසින් ක්‍රියාත්මක කරන ලද උපාධි වැඩසටහන් සංඛ්‍යාව පහත පරිදි වේ.

**සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය**

සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය යටතේ පහත දැක්වෙන උපාධි වැඩසටහන් 5 ඉදිරිපත් කරන ලදි.

- සත්ව විද්‍යාවේදී උපාධිය (බී.ඒ.එස්.සී.)
- අපනයන කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බී.එස්.සී.)
- තේ තාක්ෂණවේදය සහ අගය එක් කිරීම පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බී.එස්.සී.)
- ජලජ සම්පත් තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බී.එස්.සී.)
- තාල වෘක්ෂ සහ වෘක්ෂ ක්ෂීර තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බී.එස්.සී.)

**විද්‍යා සහ තාක්ෂණවේද පීඨය**

විද්‍යා සහ තාක්ෂණවේද පීඨය යටතේ පහත දැක්වෙන උපාධි වැඩසටහන් 4 ඉදිරිපත් කරන ලදි.

- විද්‍යාව සහ තාක්ෂණවේදය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය (බී.ටෙක්.)
- පරිගණක විද්‍යාව සහ තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බී.එස්.සී.)
- කර්මාන්ත ආශ්‍රිත තොරතුරු තාක්ෂණවේදය පිළිබඳ ප්‍රථම උපාධිය (බී.අයි.අයි.ටී.)
- ඛනිජ සම්පත් සහ තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බී.එස්.සී.)

**කළමනාකරණ පීඨය**

කළමනාකරණ පීඨය යටතේ පහත දැක්වෙන උපාධි වැඩසටහන් 2 ඉදිරිපත් කරන ලදි.

- ව්‍යවසායකත්වය සහ කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය (බී.බී.එම්.)
- සත්කාරකත්ව, සංචාරක සහ විශේෂ අවස්ථා පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය (බී.බී.එම්.)

## 10.3 සහතික පත්‍ර වැඩසටහන්

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් 2010 වර්ෂයේදී පහත සඳහන් ව්‍යාප්ති වැඩසටහන් පාඨමාලා මෙහෙයවන ලදි.

විද්‍යා සහ තාක්ෂණවේද පීඨය යටතේ මෙහෙයවන ලද කෙටි කාලීන පාඨමාලා

- පරිගණක ව්‍යවහාරයන් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- උසස් පරිගණක ව්‍යවහාරයන් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- වෙබ් අඩවි නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- පරිගණක දෘඩාංග තාක්ෂණවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

**කළමනාකරණ පීඨය විසින් මෙහෙයවන ලද කෙටි කාලීන පාඨමාලා**

- කණිෂ්ට විධායකයින් සඳහා ඉංග්‍රීසි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- පාසල් හැර යන්නන් සඳහා ඉංග්‍රීසි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

## 10.4 ප්‍රජා සේවා සම්පාදක වැඩසටහන්

සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම පීඨය යටතේ පහත දැක්වෙන ප්‍රජා සේවා සම්පාදක වැඩසටහන් මෙහෙයවන ලදි.

- **යාවජීව ඉගෙනුම (එල් 3)** වැඩසටහන
  කාර්යමණ්ඩලයේ සාමාජිකයින් කීප දෙනෙක් ගල්ගෙපිටියේ ගම් තේරීමේ සහ වාතාවරණ විශ්ලේෂණ සංචාර වැඩසටහන්වලට සහභාගී වූහ. බිම්මල් වගාව, කිරිපට්ටි කළමනාකරණය සහ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා ද ඇතුළුව, තාක්ෂණය ලබා දීම සඳහා වූ ඉල්ලීම් ගණනාවක් ගම්වාසීන් විසින් ඉදිරිපත් කරන ලදී. බිම්මල් වගාව සහ වෙනත් ඉල්ලීම් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු පිණිස කටයුතු සිදු කෙරෙමින් පවතී.

- **පාරිසරික බලපෑම් තක්සේරුව (ඊ.අයි.ඒ.) - (ඌව)**
  දයානි ගුණතිලක මිය ඌව පළාතේ පාරිසරික තක්සේරු කමිටුවේ සාමාජික වශයෙන් පත් කරන ලදි. සිදු කරන ලද පාරිසරික බලපෑම් තක්සේරු කීපයකටම ඇය සහභාගි වූ අතර, වැව්ලි කෘෂිකර්මය පිළිබඳ සිය විශේෂඥතාඥානය ලබා දී ඇත.
  දයානි ගුණතිලක මිය ඌව පළාතේ පාරිසරික තක්සේරු කමිටුවේ සාමාජික වශයෙන් පත් කරන ලදි. සිදු කරන ලද පාරිසරික බලපෑම් තක්සේරු කිහිපයට ඇය සහභාගි වී, වැව්ලි කෘෂිකර්මය පිළිබඳ සිය තාක්ෂණික විශේෂඥතාඥානය ලබා දී ඇත.

- **මධ්‍යම පරිසර අධිකාරිය සමග ඒකාබද්ධ වූ මූලික පාරිසරික විමර්ශනය (අයි.ඊ.ඊ)**
  ශ්‍රී ලංකාවේ තණමල්විල, නිකවැව අක්කර 100 ක වපසරිය සහිත ඉඩමක වාණිජ පරිමාණ එළවළු සහ පළතුරු (ඩ්‍රැගන් ෆෲට් / පිටායා) ගොවිපලක් පිහිටුවීම පිණිස පාරිසරික බලපෑම් තක්සේරුව ආශ්‍රිත මූලික පාරිසරික විමර්ශනය (අයි.ඊ.ඊ) සිදු කළ කණ්ඩායමේ සාමාජිකාවක වශයෙන් පී.ඊ. කාලියදාස මිය සේවය කරමින් සිටියාය.

- **ඌව පළාත් සභාවේ සංවර්ධන මූලකෘත්‍යයන් සඳහා වූ වැඩසටහන**
  පී.ඊ. කාලියදාස මිය ශ්‍රී ලංකාවේ ඌව පළාත් සභාවේ සභාවේ සංවර්ධන මූලකෘත්‍යයන් සඳහා වූ ව්‍යාපෘතියෙහි වැඩසටහන් සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරමින් පසු වූවාය.

- **ගොවිපලෙහිදීම ආකන්ද බෝගවල ජනකප්ලාස්මය සංරක්ෂණය කිරීම**
  ගොවිපලෙහිදීම ජනකප්ලාස්මය සංරක්ෂණය කිරීමේ මාර්ගයක් වශයෙන් 2010 මැයි 15 වැනි දින බදුල්ල සිරිමල්ගොඩ, මදුරුකොළතැන්න හා ඉලුක්තැන්න ගොවීන් අතර සාම්ප්‍රදායික ආකන්ද බෝග වර්ග කීපයක් බෙදා දෙන ලදි.

- **වන වගාවන්හි නව ආක්‍රමණික පළිබෝධ විශේෂයක් (කපුරු පිළිල දෙබරා) පිළිබඳව විමර්ශනය කිරීම**
  බදුල්ල කොට්ඨාස වන කාර්යාලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව පියුමිකා අබේසේකර මිය විසින් ආදාවත්ත වතුයාය (ෆින්ලේ සමූහය) වෙත ක්ෂේත්‍ර සංචාරයක් සිදු කරන ලදි. පියුමිකා මිය වන වගාවෙහි මෙම නව ආක්‍රමණික පළිබෝධ විශේෂය පිළිබඳව විමර්ශනය කරනු පිණිස අදාළ ව්‍යාපෘතියෙහි කටයුතු කරමින් පසු වූවාය.

- පෞද්ගලික අංශ කර්මාන්තවල සහභාගිත්වයෙන් පවත්වන ලද ඒකාබද්ධ පර්යේෂණය, නව නිෂ්පාදන සංවර්ධනය කිරීමෙහිලා සහ ජාතික සංවර්ධනයට දායක වීමෙහිලා සාර්ථක බව සනාථ විය. කැපී පෙනෙන නිෂ්පාදන වූයේ බල හා තිලාපි මත්ස්‍යයින්ගෙන් නිපදවා ගන්නා සම් සහ චොක්ලට් ඇතිරූ කස්ටඩ් යෝගට් වර්ගයයි.

- තෝරා ගත් ජලාශ දෙකක (උල්හිටිය සහ ඌරුසිටා වැව) මත්ස්‍ය ඇඟිල්ලන් කොටු ස්ථාපනය කිරීමේ පර්යේෂණ වැඩසටහන ප්‍රජා සහභාගිත්වය ඇතිව සිදු කොට සම්පූර්ණ කරන ලදි. කොටු ඉදිකිරීම, ආහාර දැමීම, ඇති කිරීම සහ ජල තත්ත්වය කළමනාකරණය කිරීම පිළිබඳ තාක්ෂණික ඥානය උල්හිටිය සහ ඌරුසිටා වැව ධීවර ප්‍රජාව වෙත ලබා දෙන ලදි. උල්හිටිය ප්‍රජාවට වඩා සාර්ථක ප්‍රතිඵල ඌරුසිටා වැව ප්‍රජාව අත් කර ගන්නා බව සාමාජීය ආර්ථික අධ්‍යයනයක් සිදු කිරීමෙන් පෙනී ගියේය.

- **විද්‍යා කඳවුර - 2010**
  2010 විද්‍යා කඳවුර පෙබරවාරි 1 වන දින සිට 3 වන දින දක්වා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේදී පවත්වන ලදි. ආර්.එම්.ජී.එන්. රාජපක්ෂ මිය සහ එන්.පී.පී. ලියනගේ මහතා අ.පො.ස. උසස් පෙළ සඳහා ජලජ විද්‍යා පංති සහ දේශන මෙහෙයවීමෙහිලා ක්‍රියාකාරී ලෙස සහභාගි වී ඇත.

## 10.5 කාර්යමණ්ඩල සංවර්ධනය, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (එස්.ඩී.සී.) 2010 වර්ෂයේදී අධ්‍යයන සහ කාර්යමණ්ඩල සාමාජික සංවර්ධනය කරා යොමු වන විවිධ ක්‍රියාකාරකම්වල නිරත වී ඇත. වර්ෂයේ ප්‍රධාන අවධාන නාභිය වූයේ විශ්වවිද්‍යාලයේ යොවුන් කාර්යමණ්ඩලය පුහුණු කිරීම පිණිස ඉතාමත් අවශ්‍ය දෙය වූ උසස් අධ්‍යාපනයෙහි ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සම්පූර්ණ කිරීමයි. දැනට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සංඛ්‍යාව සීමිත වූ බැවින් බැහැරින් සම්පත්දායකයින් සඳහා ආරාධනා කරන ලදී.

### 1. උසස් අධ්‍යාපනයෙහි ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

උසස් අධ්‍යාපනයෙහි ඉගැන්වීම පිළිබඳ පළමු සහතික පත්‍ර පාඨමාලාව සඳහා කාර්යමණ්ඩල සාමාජිකයින් 49 දෙනෙක් ලියාපදිංචි වී සිටි අතර, 26 දෙනෙක් පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර ඇත. උසස් අධ්‍යාපනයෙහි ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2010 ජූනි 17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරන ලදී. (UGC/IUA/STD/01/10) තවද, කාර්යමණ්ඩල සාමාජිකයින්ට අවශ්‍ය වූ දැනුම ලබා දෙනු පිණිස වැඩමුළු කීපයක් මෙහෙයවන ලදී. (1 වගුව)

### 2. ස්වයං ඇගැයීම් වාර්තාව

කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ස්වයං ඇගැයීම් වාර්තාව පිළියෙළ කොට විශ්වවිද්‍යාලයේ පොදු ස්වයං ඇගැයීම් වාර්තාවේ 5.0 අංශය යටතේ ඇතුළත් කරන ලදී. කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ආයතනික සමාලෝචනයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පිළිබඳව සාකච්ඡා කළ අතර, සමාලෝචන කණ්ඩායමේ සාමාජිකයෝ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රගතිය පිළිබඳව සෑහීමට පත් වී තිබේ.

### 3. පුහුණුව සහ වැඩමුළු

2010 වර්ෂය තුළ අධ්‍යයන මෙන්ම අනධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ දැනුම සහ ධාරිතාව වර්ධනය කරනු පිණිස වෙනත් ආයතනයන්හි පවත්වන ලද පුහුණු කිරීම්, වැඩමුළු හා සම්මන්ත්‍රණ වලට සහභාගී වීමට ඉඩ ප්‍රස්ථා සලසා දෙන ලදී. එමෙන්ම කාර්යමණ්ඩල සාමාජිකයින්ට විද්වත් සමුළුවලට හා සම්මන්ත්‍රණවලට ලියාපදිංචි වීමට හා සහභාගී වීමට අවස්ථා සලසා දෙන ලදී. 2010 සිදු කරන ලද එවැනි ක්‍රියාකාරකම් 1 වගුවේ දැක්වේ.

| අංකය | පුහුණුව/සම්මන්ත්‍රණය /වැඩමුළුව | ස්ථානය | දින ගණන | සහභාගික සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | බැර යන්ත්‍ර පිළිබඳ පුහුණුව | සෙනොක් (SENOK) බත්තරමුල්ල | දින 1 | පරිපාලන කාර්යමණ්ඩල සාමාජිකයින් 01 |
| 02 | රාජ්‍ය මුදල් සහ සංවර්ධනය පිළිබඳ පුහුණුව | රාජ්‍ය මූල්‍ය ආයතනය සහ සංවර්ධන අධිකාරිය | දින 1 | පරිපාලන කාර්යමණ්ඩල සාමාජිකයින් 03 |
| 03 | ගුණාත්මකතා තහවුරුව පිළිබඳ වැඩමුළුව | ජාතික විද්‍යා පදනම | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 04 |
| 04 | උසස් අධ්‍යාපනයෙහි තක්සේරු ක්‍රම | බ්‍රිතාන්‍ය කවුන්සිලය | දින 1 | පරිපාලන කාර්යමණ්ඩල සාමාජිකයින් 01 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන- එස්.එල්.ඒ.එච්.ඊ.ඊ. 6 වන ඒකාබද්ධ වැඩමුළුව | කොළඹ විශ්වවිද්‍යාලීය උපාධි අධ්‍යයන පීඨය | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 16 |
| 06 | ව්‍යාපාර සහ තොරතුරු පිළිබඳ ජාත්‍යන්තර සමුළුව | කැළණිය විශ්වවිද්‍යාලය | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 02 |
| 07 | පුස්තකාල සංගමය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව | කැළණිය විශ්වවිද්‍යාලය | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 02 |
| 08 | අපනයන නිපැයුම්වල ගුණාත්මකතාව පිළිබඳ පුහුණුව | ලංකා වාණිජ මණ්ඩලය | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 01 |
| 09 | බැංකු කටයුතු අධ්‍යයනය පිළිබඳ වැඩමුළුව | ශ්‍රී ලංකා මහ බැංකුව | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 01 |
| 10 | එස්.ඒ.එල්.බී.එස්. සමුළුව | කැළණිය විශ්වවිද්‍යාලය | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 01 |
| 11 | ශ්‍රී ලංකාව සඳහා පුහුණු සහ සංවර්ධන පද්ධති සංවර්ධනය කර ගැනීම | මානව සම්පත් කළමනාකරණය ආයතනය | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 01 |
| 12 | සාර්ව ආර්ථික ප්‍රතිපත්තියෙහි ජාත්‍යන්තර මාන පිළිබඳ වැඩමුළුව | බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 01 |
| 13 | උපාධි අපේක්ෂකයින් වඩාත් සඵලදායි කරනු පිණිස ඉගැන්වීම දියුණු කිරීම | කොළඹ විශ්වවිද්‍යාලය | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 01 |
| 14 | ස්වාභාවික නිෂ්පාදන සඳහා ජෛව අර්සණයන් පිළිබඳ වැඩමුළුව | අයි.එෆ්.එස්. මහනුවර | දින 2 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 04 |
| 15 | උසස් අධ්‍යාපනය තුළ විශිෂ්ටතම පිළිවෙත් පවත්වා ගැනීමෙහි අභියෝග | කොළඹ විශ්වවිද්‍යාලය | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 16 |
| 16 | ‘කෘෂි රසායන: කෘෂි රසායනවල විශ්ලේෂණය සහ පරිසරය හා සෞඛ්‍යය මත බලපෑම | රසායන විද්‍යා ආයතනය | දින 1 | අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 03 |

## 11. ලැබුණු ප්‍රදානයන්හි විස්තර

2010 වර්ෂය සඳහා මෙම විශ්වවිද්‍යාලයට භාණ්ඩාගාර ප්‍රතිපාදන හැර කිසිදු ප්‍රදානයක් නොලැබුණි.

## 12. ආරම්භ කරන ලද නව පාඨමාලා

මහජනතාව සඳහා වූ ව්‍යාප්ති වැඩසටහන් යටතේ 2010 වර්ෂය තුළ පහත සඳහන් නව සහතික පත්‍ර පාඨමාලාවන් 3 ආරම්භ කරන ලදී.


- උසස් පරිගණක ව්‍යවහාරයන් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- වෙබ් නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- පරිගණක දෘඩාංග තාක්ෂණවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

මෙම වැඩසටහන් සියල්ලම ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙහෙයවන ලදී.


## 13. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂයය | 2009 (රුපියල්) | 2010 (රුපියල්) |
|---|---:|---:|
| a. පුද්ගල පඩිනඩි | 53,030,112 | 64,537, 372 |
| b. ගමන් බිමන් | 241,210 | 580,986 |
| c. සැපයුම් | 9,162,777 | 17,931,607 |
| d. නඩත්තුව | 751,949 | 1,029,217 |
| e. ගිවිසුම්ගත සේවාවන් | 55,397,904 | 66,532,314 |
| f. වෙනත් | 5,484,077 | 7,407,977 |
| **එකතුව** | **124,068,029** | **158,019,473** |

**පුනරාවර්තන වියදම 2009**





**පුනරාවර්තන වියදම 2010**




## 14. මූලධන වියදම පිළිබඳ විස්තර

| විෂයය | 2009 (රුපියල්) | 2010 (රුපියල්) |
|---|---|---|
| a. ගෘහ භාණ්ඩ සහ වෙනත් උපකරණ ලබා ගැනීම | 22,227,902 | 11,698,371 |
| b. යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම | 7,918,476 | 20,332,628 |
| c. ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත් කර ගැනීම | - | - |
| d. වෙනත් | 7,568,444 | 2,040,642 |
| **එකතුව** | **37,714,822** | **34,071,641** |

**මූලධන වියදම 2009**




**මූලධන වියදම 2010**




## 15. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය / විදේශීය අරමුදල් සම්පාදිත)

| නම සහ විස්තර | ණය/ආධාර ප්‍රදාන | අරමුදල් සම්පාදක ආයතනය # | ඇස්තමේන්තුගත සමස්ත පිරිවැය (රු.මි.) | ලැබුණු විදේශ ආධාර (රු.මි.) | දේශීයව සම්පාදිත අරමුදල් (රු.මි.) |
|---|---|---|---|---|---|
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය අදියර 1 සහ 2 | | | 3420.00 | | ✓ |
| ඇහළුම් කම්හල් ගොඩනැගිල්ල පිළිසකර කිරීම | | | 53.96 | | ✓ |
| **එකතුව** | | | **3473.96** | | |

## 16. ව්‍යාපෘති වියදම පිළිබඳ විස්තර (දේශීය / විදේශීය අරමුදල් සම්පාදිත)

| නම | ඇස්තමේන්තුගත සමස්ත පිරිවැය (රු.මි.) | 2009 වර්ෂය තුල වියදම (රු.මි.) | 2010 වර්ෂය තුල වියදම (රු.මි.) | 2010.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි.) | භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය අදියර 1 සහ 2 | 3420.00 | 202.64 | 189.28 | 1342.72 | 40% |
| ඇඹළුම් කම්හල් ගොඩනැගිල්ල පිළිසකර කිරීම | 53.96 | 27.53 | 0.45 | 40.37 | 95% |
| **එකතුව** | **3473.96** | **230.17** | **189.73** | **1383.09** | |

## 17.මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර

| විෂයය | 2010 ප්‍රතිපාදනය (රු.) | 2010 වියදම (රු.) | ඉතිරුම්/අතිරික්තය (රු.) |
|---|---|---|---|
| a. ව්‍යාපෘතිය හැර පුනරාවර්තන | 155,000,000 | 158,019,472 | (3,019,472) |
| b. ව්‍යාපෘතිය හැර මූලධන | 30,000,000 | 34,071,641 | (4,071,641) |
| c. ව්‍යාපෘතිය – දේශීයව අරමුදල් සම්පාදිත | 170,000,000 | 189,283,843 | (19,283,843) |
| d. ව්‍යාපෘතිය – විදේශීය අරමුදල් සම්පාදිත | - | - | - |
| **එකතුව** | **355,000,000** | **381,374,956** | **-26,374,956** |

## 18. මූල්‍ය ප්‍රගතියේ විස්තර (පොදු ආදායම)

| ආදායම් මූලාශ්‍රය | 2010 ප්‍රතිපාදනය (රු.) | 2010 එකතුව (රු.) | හිඟය/අතිරික්තය (රු.) |
|---|---|---|---|
| **a.** උපාධි අපේක්ෂක අධ්‍යයනය (නේවාසික සහ ලියාපදිංචි කිරිමේ ගාස්තු ආදිය | 5,603,000 | 6,115,454 | 512,454 |
| **b.** පශ්චාත් උපාධි අධ්‍යයනය | - | - | - |
| **c.** උපදේශකත්වයන් (පුහුණුව, විභාග සහ වෙනත්) | **2,800,000** | **2,148,560** | **(651,440)** |
| **d.** වෙනත් | **110,000** | **588,382** | **478,382** |
| එකතුව | **8,513,000** | **8,852,396** | **339,396** |

## 19. 2010 වර්ෂයේදී ලැබුණු යටිතල පහසුකම් පිළිබඳ විස්තර

| විෂයය | සූත්‍රය | ශිෂ්‍යයකු සඳහා වියදම (රු.) |
|---|---|---|
| a. එක් ශිෂ්‍යයකු සඳහා පුනරාවර්තන වියදම (RE) | පුනරාවර්තන වියදම / ශිෂ්‍ය සංඛ්‍යා ශක්තිය | 101,164 |
| b. එක් ශිෂ්‍යයකු සඳහා මූලධන වියදම (CE) | මූලධන වියදම / ශිෂ්‍ය සංඛ්‍යා ශක්තිය | 143,287 |
| එකතුව | | **244,451** |

## 20. 2010 වර්ෂයේදී ලැබුණු යටිතල පහසුකම් පිළිබඳ විස්තර

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වියදම (රු.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| පර්යේෂණාගාරය සහ දේශන ශාලා සංකීර්ණය. ඊ ගොඩනැගිල්ල | 242,927,023.61 | 100% සම්පූර්ණ කර ඇත. |
| ඉංජිනේරු වැඩපල - 1 අදියර | 73,245,163.19 | 100% සම්පූර්ණ කර ඇත. |

## 21. විගණකාධිපති වාර්තාව

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No. : යූවී/බීඩී/ඩී/2010/64
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 2011 සැප්තැම්බර් 23 දින

උපකුලපති
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.

පිටපත් :-
01. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.
02. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.
03. සභාපති - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.


නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 7
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone : 2691151
ෆැක්ස් අංකය / பெக்ஸ் இல / Fax No. : 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ மெயில் / E-mail : oaggov@sltnet.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல / My No. : යූවී/බීඩී/ඩී/2010/64 ඔබේ අංකය / உமது இல / Your No. : දිනය / திகதி / Date : 2011 සැප්තැම්බර් 23 දින.

උපකුලපති
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය.

**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3),(4) සහ (7) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම්කිරීම, ක්‍රියාත්මකකිරීම සහ පවත්වාගෙනයාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.


නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 7
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone 2691151
ෆැක්ස් අංකය / பெக்ஸ் இல / Fax No. 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ மெயில் / E-mail. oaggov@sltnet.lk

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 මතය
-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

විගණනයේදී පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010 දෙසැම්බර් 31 දින ට වෛද්‍ය මධ්‍යස්ථානයේ ඉතිරිව තිබූ රු. 538,486 ක් වටිනා බෙහෙත් තොග ශේෂ පත්‍රයේ වත්කමක් ලෙස පෙන්නුම් කර නොතිබුණි.

(ආ) 2007-2010 වර්ෂවලදී මිලදීගෙන තිබූ එකතුව රු. 59,550 ක්වූ පන්දු 100 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ ගිණුමේ ඇතුලත් 2008 වර්ෂයේදී මිලදී ගෙන තිබුන රු. 173,400 ක් වටිනා බහු ප්‍රක්ෂේපන යන්ත්‍රයක් 2009 වර්ෂයේදී නැතිවී තිබූ අතර එහි වටිනාකම 2010 පෙබරවාරි මස පුද්ගලික ආරක්ෂක සේවාවට ගෙවිය යුතු බිලෙන් අඩුකර ගෙවා ඇති මුත් ඒ සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

(ඈ) 2006,2007,2008 හා 2009 වර්ෂවලදී විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරවල පදිංචිව සිටි සිසුන්ගෙන් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු නේවාසිකාගාර ගාස්තු රු. 597,500 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2011 පෙබරවාරි 28 දින පැවති 2010 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව තොගවල අතිරික්ත හා ඌනතා වටිනාකම් පිළිවෙලින් රු. 26,740 ක් හා 12,199 ක් ජ'නල් සටහන් මගින් නිවැරදිව තොග ගිණුමට ගලපා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා කාර්ය මණ්ඩලයේ 3 දෙනෙකුට ලබාදුන් රු.36,698 ක අත්තිකාරම් 2010 දෙසැම්බර් 31 දිනට නොපියවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් පෙන්නුම් කෙරිණි.

2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිකම නිසා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යතිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් අත්පත් කර ගැනීම | 17,295,907 | හිමිකම් සහතික |
| කාර්යාල උපකරණ | 2,474,143 | වටිනාකම සනාථ කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| පරිගණක යන්ත්‍ර | 23,281,635 | |
| ක්‍රීඩා භාණ්ඩ | 1,532,828 | |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 32,590,936 | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 1,381,220 | තැන්පත් ලේඛන/උපලේඛන |
| උපචිත වියදම් | 5,900,300 | උපයෝගී ලේඛන/විස්තරාත්මක උපලේඛන |

2.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 14(1) වගන්තිය | කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | |
| | (i) 109 වගන්තිය | විශ්වවිද්‍යාලයේ 2009 වාර්ෂික වාර්තාව රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. |
| | (ii) 110 වගන්තිය | විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතින් සංශෝධිත1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තිය | 2006-2010 කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් මෙහෙයුම් සහකරුවන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් රු. 2,458,130 ක් ගෙවා නොතිබුණි. |
| (ඈ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | 2006-2010 කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් මෙහෙයුම් සහකරුවන් වෙනුවෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් රු. 368,719 ක් ගෙවා නොතිබුණි. |
| (ඉ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ නියමිත විරාම කාලයන්හිදී ගබඩා සමීක්ෂණ සිදුකර නොතිබුණි. |
| (ඊ) | 1980 පෙබරවාරි 13 දිනැති අංක 63 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 6.3 වගන්තිය | ඇස්තමේන්තුගත වියදම හා ආදායම සහ තථ්‍ය සංඛ්‍යා අතර වෙනස්කම් පිළිබඳ වාර්තාවක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක යන්ත්‍ර හා උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඌ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| | (i) 1994 ඔක්තෝබර් 21 දිනැති අංක 37/94 දරන චක්‍රලේඛය | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබානොගෙන ව්‍යාපෘති මෙහෙයුම් කළමනාකරු තනතුර සඳහා වයස අවුරුදු 70 ඉක්මවූ විශ්‍රාම නිලධාරියෙකු පැවරුම් පදනම මත 2005 දෙසැම්බර් 31 දින සිට මාස 06 ක කාලයක් සඳහා බඳවාගෙන මේ දක්වා මාස තුන බැගින් ඔහුගේ සේවා කාලය දීර්ඝ කර තිබුණි. |
| | (ii) 2008 ජූලි 30 දිනැති අංක 21/2006(iv) දරන චක්‍රලේඛය | 2005, 2006 හා 2007 වර්ෂවලදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද මේ දක්වා විශ්ව විද්‍යාලයේ සේවය කරන මෙහෙයුම් සහකරුවන් 17 දෙනෙකුගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (එ) | මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ. 104 | නැතිවූ වත්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 110 | පාඩු හා හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (iii) මු.රෙ. 756 | පුස්තකාල පොත් හා ඉතිරි බෙහෙත් තොග සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණයක් කර නොතිබුණි. |

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතුවලින් පුනරාවර්තන වියදම සඳහා ලැබුණු රු. 152,800,000 ක්වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පසුව රු. 2,450,399 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම සඳහා ලැබුණු රු. 108,870,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පසුව රු. 10,441,719 ක ඌනතාවයක් විය. මේ අනුව, සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 12,892,118 ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර, පුනරාවර්තන ප්‍රදාන, ස්වයං මූල්‍ය වැඩසටහන් ආදායම සහ අනෙකුත් ආදායම වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 මෙහෙයුම් සමාලෝචනය

#### 3.2.1 අධ්‍යයන කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂය සමඟ සැසඳීමේදී 2010 වර්ෂයට ශිෂ්‍යයන් 45 දෙනෙකු එනම් 8.5% ක් අඩුවෙන් බඳවාගෙන තිබුණි.

(ආ) 2006 සිට 2010 වර්ෂය දක්වා විශ්ව විද්‍යාලයට බඳවාගත් සිසුන් 68 දෙනෙකු පාඨමාලා හැර ගොස් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද අවසන් වසර විභාග සඳහා පෙනී සිටි සිසුන් 151 දෙනාගෙන් 148 ක් සමත් වී 03 දෙනෙක් ඌන සාමාර්ථයන් ලබා තිබුණි.

#### 3.2.2 ඒක ශිෂ්‍ය පිරිවැය

2006-2010 වර්ෂ සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව සහ මුළු පුනරාවර්තන වියදම අනුව ගණනය කරන ලද ඒක ශිෂ්‍ය පිරිවැය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු පුනරාවර්තන වියදම | ඒක ශිෂ්‍ය වියදම |
|---|---|---|---|
| | | රු. | රු. |
| 2006 | 167 | 39,282,684 | 235,226 |
| 2007 | 370 | 74,375,733 | 201,015 |
| 2008 | 741 | 118,634,901 | 160,101 |
| 2009 | 1,257 | 152,982,159 | 121,704 |
| 2010 | 1,715 | 200,874,819 | 117,128 |

පුනරාවර්තන වියදමට සාපේක්ෂව ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීමෙන් ඒක ශිෂ්‍ය පිරිවැය ක්‍රමයෙන් අඩුවී තිබුණි.

3.2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිගණක පද්ධති

(i) විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සඳහා පරිගණක පද්ධතියක් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. 3,680,000 ක ගිවිසුම් මුදලකට 2006 වර්ෂයේදී Gate Way Centre for Information Technology පෞද්ගලික සමාගම සමඟ ගිවිසුමකට එළඹ එම සමාගමට ගිවිසුම් මුදලෙන් 20% ක්වූ රු. 736,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාර පරිගණක පද්ධතිය සපයා නොතිබුන අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ රු. 368,000 ක්වූ කාර්යසාධන බැඳුම්කරයේ වලංගු කාලය 2007 පෙබරවාරි 20 දිනෙන් අවසන් වී තිබුණි. ගිවිසුම ප්‍රකාරව පරිගණක පද්ධතිය සැපයීමට කටයුතු නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට සිදුවූ අලාභය මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සිසුන්ගේ පරිගණක අධ්‍යයන කටයුතු සඳහා කුලී පදනම මත පරිගණක යන්ත්‍ර 110 සැපයීම වෙනුවෙන් 2007 සිට 2010 දක්වාවූ වර්ෂ 04 තුළදී රු. 22,870,727 ක මුදලක් පෞද්ගලික සමාගමකට ගෙවා තිබුණි. වෙළඳ පොලේ මිල ගණන් සැලකිල්ලට ගැනීමේදී ඉකුත් වර්ෂවලදී පරිගණක යන්ත්‍ර කුලියට ගැනීම සඳහා ගෙවූ මුදලෙන් නව මාදිලියේ පරිගණක යන්ත්‍ර 280 ක් මිළදී ගැනීමට විශ්ව විද්‍යාලයට හැකියාව තිබුණ බව නිරීක්ෂණය විය.

(ආ) නේවාසික පහසුකම්

(i) විශ්ව විද්‍යාලය විසින් කාර්ය මණ්ඩලයේ 59 දෙනෙකුට නේවාසික පහසුකම් සැපයීම සඳහා මාසිකව කුලී ගෙවීම් පදනම මත නිවාස 38 ක් බද්දට ගෙන තිබූ අතර ඒ වෙනුවෙන් 2010 වර්ෂය සඳහා නිවාස අයිතිකරුවන්ට කුලී වශයෙන් රු. 3,654,496 ක් ගෙවා තිබුණි. නමුත් නේවාසික කාර්ය මණ්ඩලයෙන් නිවාස කුලී හා ගාස්තු වශයෙන් අයකර ගෙන තිබුණේ රු. 521,762 ක මුදලක් පමණි. ඒ අනුව නේවාසික නිවාසවලට කුලී ගෙවීම සඳහා විශ්ව විද්‍යාලයට වාර්ෂිකව රු.3,132,734 ක පමණ අමතර වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(ii) විශ්වවිද්‍යාලය විසින් තනිකඩ නිවාස සඳහා බදුකුලී ගෙවීමට අමතරව මාසික විදුලි හා ජල බිල්පත් ද ගෙවා තිබුන නමුත් එම නිවාසවල නේවාසිකව සිටින කාර්ය මණ්ඩලයෙන් කිසිම කුලියක් හෝ ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි.

3.2.4 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය නොසලකා 2006, 2007 හා 2009 වර්ෂ සඳහා ශිෂ්‍ය අත්පොත් මුද්‍රණය කිරීමේ හේතුවෙන් පිරිවැය රු. 172,825 ක්වූ ශිෂ්‍ය අත්පොත් 557 ක් ඉතිරිවී තිබුණි.

(ආ) 2010 ජුනි 29 දිනැති අභ්‍යන්තර විගණන වාර්තාව අනුව රු. 76,422 ක් වටිනා පුස්තකාල පොත් 145 ක් අස්ථානගත වී තිබුණි.

(ඇ) වෛද්‍ය මධ්‍යස්ථානයේ වර්ග 29 කට අයත් බෙහෙත් තොග කල් ඉකුත් වී තිබුණි.

(ඈ) අවශ්‍යතාවයට වඩා මිළදී ගෙන තිබූ ඇඳන් 76 ක් හා මෙට්ට 198 ක් 2010 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ සහ බ්ලොක් F ගොඩනැගිල්ලේ ගබඩාකර තිබුණි.

(ඉ) 2010 ජුනි 30 දින මිළදී ගෙන තිබූ රු. 322,560 ක් වටිනා ගිනි ආරක්ෂක සේප්පු 05 ක් 2011 මැයි 31 දින වනවිටත් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ තිබුණි.

3.2.5 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට 2011 අගෝස්තු 04 දින දක්වා විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මහාචාර්ය තනතුරු 07 ක් හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය තනතුරු 03 ක් සඳහා බඳවා ගැනීම් කර නොතිබුණි. 2010 දෙසැම්බර් 31 දිනට අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 129 න් 32 ක් පුරප්පාඩුව පැවතිණි.

(ආ) අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 82 න් 58 ක් පුරප්පාඩුව පැවතිණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය නොමැතිව 2006 නොවැම්බර් මාසයේ සිට 2011 අගෝස්තු 04 දින දක්වා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ වැඩබලන පාඨමාලා අධ්‍යක්ෂ ලෙස නිලධාරියෙකු බඳවාගෙන රු.378,000 ක දීමනාවක් සමඟ රු.154,419 ක ප්‍රවාහන දීමනාවක් සමාලෝචිත වර්ෂය තුල දින 37 ක් සේවය කිරීම වෙනුවෙන් ගෙවා තිබුණි.

3.2.6 අයවැය පාලනය

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබුණු බවක් දක්නට නොලැබුණි.

4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය

(ඇ) ස්ථාවර වත්කම්

(ඇ) ගබඩා

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.

## 22. විගණකාධිපතිතුමාගේ වාර්තාවේ මතු කර ඇති ප්‍රශ්නවලට පිළිතුරු

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය ප්‍රකාරව 2010 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳව විගණකාධිතුමාගේ වාර්තාවේ මතු කර ඇති කාරණා සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ ප්‍රතිචාර

| විගණකාධිපතිතුමාගේ සටහන් | විශ්වවිද්‍යාලයේ පිළිතුරු |
|---|---|
| **2.2** ගිණුම් පිළිබඳ සටහන් | |
| **2.2.1** ගිණුම්කරණ ඌණතා<br><br>(අ) 2010 දෙසැම්බර් 31 වන දිනට වෛද්‍ය මධ්‍යස්ථානයේ තිබූ රුපියල් 538,486 ක් වූ ඖෂධවල වටිණාකම වත්කමක් වශයෙන් ශේෂ පත්‍රයට ගෙනැවිත් නොතිබුණි. | වෛද්‍ය මධ්‍යස්ථානය වෙත නිකුත් කර තිබූ ඖෂධ නිකුත් කිරීම් වශයෙන් සලකන ලද අතර, එය ඒ අනුව ගිණුම්ගත කරන ලදී. වෛද්‍ය මධ්‍යස්ථානයේ ඇති ඉතිරි ඖෂධ වලට කල් ඉකුත් වූ ඖෂධද ඇතුළත්ය. |
| (ආ) 2007 සිට 2010 දක්වා වූ වර්ෂ තුළ මිලට ගෙන තිබූ, සමස්ත වශයෙන් රුපියල් 59,550 ක් වූ පාපන්දුවල වටිණාකම මූලධන වත්කම් වශයෙන් ගිණුම්ගත කොට තිබුණි. | මෙම ක්‍රීඩා භාණ්ඩ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කෙරෙමින් පවතී. |
| (ඇ) 2008 වර්ෂයේදී මිලට ගනු ලැබූ, පර්යේෂණාගාර හා ඉගැන්වීම් උපකරණ යටතේ ගිණුම්ගත කොට තිබූ රුපියල් 173,400 ක් වූ බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය (මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරය) 2009 වර්ෂයේදී අස්ථානගත විය. 2010 පෙබරවාරි මාසයේදී පෞද්ගලික ආරක්ෂක ආයතනය වෙත ගෙවිය යුතු මුදලින් මෙම වටිණාකම අඩු කරන ලද නමුදු, ගිණුම්වල සීරුමාරු කිරීම් සිදු කොට නොතිබුණි. | මේ සම්බන්ධයෙන් බදුල්ල පොලිසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කොට ඇති අතර, ඒ පිළිබඳ පරීක්ෂණ තවමත් අවසන් කොට නොමැත. පොලිස් වාර්තාව ලැබුණු වහාම මෙම භාණ්ඩය ගිණුමෙන් ඉවත් කිරීමටත්, මෙම අඩුව සීරුමාරු කිරීමටත් කටයුතු කෙරෙනු ඇත. |
| (ඈ) 2006, 2007, 2008 හා 2009 වර්ෂ සඳහා නේවාසිගාරවල වාසය කළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙතින් 2010 | මූලික ගෘහභාණ්ඩ අවශ්‍යතාවන් සපයා නොතිබූ බැවින් මුල් අවධියේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙතින් කිසිදු නේවාසිකාගාර |

| | |
|---|---|
| දෙසැම්බර් 31 වන දිනට අය විය යුතු රුපියල් 597,500 ක් වූ නේවාසිකාගාර ගාස්තු ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. | ගාස්තුවක් අය කර ගනු නොලැබීය. කෙසේ වුවද, අය විය යුතු මුදල් 2008 හා 2009 වර්ෂ තුළදී අය කර ගැනීමට කටයුතු කරන ලදී. |
| (ඉ) 2008 පෙබරවාරි 28 වන දින භාණ්ඩ සමමීක්ෂණ මණ්ඩලයේ වාර්තාවට අනුව, 2010 වර්ෂය සඳහා වූ ස්කන්ධවල පිළිවෙලින් රුපියල් 26,740 සහ රුපියල් 12,199ක් වූ අතිරික්තයන් හා හිඟයන් පිළිබඳව ජර්නල සංලේඛ මගින් ස්කන්ධ ගිණුමට නිවැරදි ලෙස සීරුමාරු කර නොතිබුණි. | මෙම ගැලපුම් දක්වන සනාථ කිරීමේ ලියැවිලි 2011/07/15 දිනැති ඔබේ විමසුම් අංක UV/BD/2010/64 සඳහා ලබා දුන් පිළිතුර සමග ඉදිරිපත් කර තිබේ. නිවැරදි ලෙස සීරුමාරු කිරීමෙන් පසුව මුළු ස්කන්ධ ප්‍රමාණය අවසන් ගිණුම්වල දක්වා ඇත. |
| (ඊ) වියදම් පියවා ගනු පිණිස නිලධාරීන් තිදෙනකුට ලබා දී තිබූ රුපියල් 36,698 ක් වූ අත්තිකාරම් මුදල් 2010 දෙසැම්බර් 31 වන දිනට පියවා නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම එම මුදලට සමාන අගයකින් අඩු ව දැක්විණි. | මෙම සියලු අත්තිකාරම් මේ වන විට පියවා ඇත. 2011 වර්ෂය සඳහා වන ගිණුම් තුළ අවශ්‍ය සීරුමාරු කිරීම් සිදු කෙරෙනු ඇත. |

**2.2.2** විගණනය සඳහා සාක්ෂ්‍ය හිඟකම

| විෂයාංගය | වටිණාකම (රුපියල්) | ඉදිරිපත් නොකරන ලද සාක්ෂ්‍ය | |
|---|---|---|---|
| ඉඩම් අත්කර ගැනීම | 17,295,907 | හිමිකම් ඔප්පු | එම පැවරුම් නියෝගයට අදාළ 2005.02.07 දින අංක 05/0183/035/001 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ 2005.04.04 දින අංක 1387/1 දරන ගැසට් නිවේදනය ඔබතුමාගේ 2011.07.15 දින අංක UV/BD/2010/64 දරන විමසුමට එවූ පිළිතුර සමග දැනටමත් එවා ඇත. |
| කාර්යාලීය උපකරණ | 2,474,143 | වටිණාකම සතොක්ෂණය කර ගැනීම සඳහා වූ | සාක්ෂ්‍ය සනාථ කරනු පිණිස විගණන නිලධාරීන් වෙත |

| | | | |
|---|---|---|---|
| පරිගණක | 23,281,635 | සමීක්ෂණ මණ්ඩල වාර්තා | සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් කරන ලදි. |
| ක්‍රීඩා භාණ්ඩ | 1,532,828 | | |
| පුස්තකාල ග්‍රන්ථ සහ වාර ප්‍රකාශන | 32,590,936 | | |
| ආපසු ගෙවනු ලබන තැන්පතු | 1,381,220 | තැන්පතු ලේඛන / උපලේඛන | ඉදිරිපත් කිරීමට කටයුතු කෙරෙනු ඇත. |
| උපචිත වියදම් | 5,900,300 | පර්යේෂණාගාර ලේඛන / විස්තරාත්මක උපලේඛන | වියදම වැය විෂය ලෙජරයේ ඇතුළත් කරනු ලබන අතර, ජර්නල සංලේඛයන් මගින් උපචිත ගිණුමට පවරනු ලැබේ. මීළඟ වර්ෂයේ සිට උපචිත ගිණුම සඳහා නව ලේඛනයක් විවෘත කෙරෙනු ඇත. |

| | | |
|---|---|---|
| **2.2.3**<br>(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | | |
| (i) 109 වගන්තිය | විශ්වවිද්‍යාලයේ 2009 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව රජයේ ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. | වාර්ෂික ගිණුම් 2011/08/26 දින ගැසට් පත්‍රයේ පළ කර ඇත. |
| (ii) 110 වගන්තිය | විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශයන්ද සමගින් වාර්ෂික වාර්තාවේ කෙටුම්පත් කළ පිටපතක් ඉදිරිපත් කර නොතිබුණි. | 2009 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු පිණිස උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යවා ඇත. |
| (ඇ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 15 වගන්තිය සහ 1985 අංක 01 දරන | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ මෙහෙයුම් සහකාරවරු වෙනුවෙන් 2006-2010 කාලපරිච්ඡේදය සඳහා සේවක අර්ථසාධක | නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් ලැබුණු උපදෙස් විශ්වවිද්‍යාල සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, සභාවේ තීරණය අනුව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල හෝ සේවක |

| | | |
|---|---|---|
| සංශෝධන පනතේ 02 වගන්තිය | අරමුදල වෙත ගෙවිය යුතු දායක මුදල වන රුපියල් 2,458,130 ක මුදල ගෙවා නොතිබුණි. | අර්ථසාධක අරමුදල වෙත දායක මුදල් ගෙවීමට කටයුතු කෙරෙනු ඇත. |
| (ඇ) 1980 අංක 46 දරන සේවක භාරකාරත්ව අරමුදල පනත | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ මෙහෙයුම් සහකාරවරු වෙනුවෙන් 2006-2010 කාලපරිච්ඡේදය සඳහා සේවක භාරකාරත්ව අරමුදල වෙත ගෙවිය යුතු දායක මුදල වන රුපියල් 368,719 ක මුදල ගෙවා නොතිබුණි. | ඉහත තීරණයට අනුකූලව සේවක භාරකාරත්ව අරමුදල වෙත දායක මුදල් ගෙවීමට කටයුතු කෙරෙනු ඇත. |
| (ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධයෙන් වූ ආයතන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදයේ 1 වගන්තිය | නියමිත කාලයකට වරක් සිදු කළ යුතු තොග සත්‍යාපනය සමාලෝචිත වර්ෂය තුළ සිදු කොට නොතිබුණි. | නියමිත කාලයකට වරක් තොග සත්‍යාපනය සිදු කොට තිබූ අතර, විගණන පරීක්ෂණය අවස්ථාවේදී ඒ සම්බන්ධ සියලුම විස්තර ඉදිරිපත් කරන ලදි. |
| (ඊ) 1980 පෙබරවාරි 13 දින අංක 63 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 6.3 වගන්තිය | ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර වෙනස පිළිබඳ වාර්තාවක් මූල්‍ය ප්‍රකාශ තුළ දක්වා නොතිබුණි. | තථ්‍ය හා ඇස්තමේන්තුගත වියදම් 2010 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශයේ 39 වන පිටුවේ දක්වා තිබුණි. |
| (උ) 2002 නොවැම්බර් 28 දින අංක **IAI/2002/2** දරන මහාභාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක සහ උපාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | පරිගණක සහ උපාංග ස්ථාවර වත්කම් ලේඛනයේ අංක 08, 11, 24, 30 හා 38 දරන පිටුවල දක්වා ඇති අතර මෙම භාණ්ඩ සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යනු නොලැබේ. කෙසේ වුවද, 2002 නොවැම්බර් 28 දින අංක **IAI/2002/2** දරන මහාභාණ්ඩාගාර චක්‍රලේඛයේ අඩංගු උපදෙස්වලට අනුකූල වෙමින් ලබන වර්ෂයේ සිට මෙම භාණ්ඩ සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් |

| | | |
|---|---|---|
| | | පවත්වා ගෙන යාමට කටයුතු කෙරෙනු ඇත. |
| (ඌ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| **i.** 1994 ඔක්තෝබර් 21 දින අංක 37/94 දරන චක්‍රලේඛය | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නොමැතිව වයස අවුරුදු 70 ට වැඩි විශ්‍රාමික නිලධාරියකු අනුයුක්ත පදනමින් මාස 6 ක කාලයක් සඳහා 2005 දෙසැම්බර් 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි බඳවා ගෙන තිබූ අතර, මේ දක්වා ඔහුගේ සේවය අඛණ්ඩව මාස තුන බැගින් වූ කාලපරිච්ඡේදයන් සඳහා දීර්ඝ කර තිබේ. | අදාළ ව්‍යාපෘතිය සඳහා ප්‍රවීණ මෙහෙයුම් කළමනාකාරවරයකු ගේ සේවය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වෙයි. අනුමත සේවක මණ්ඩල සංඛ්‍යාව අනුව කාර්ය ඉංජිනේරුවරයාගේ පුරප්පාඩුව පුරවනු පිණිස අයදුම් පත්‍ර කැඳවන ලද නමුදු තෝරා ගනු ලැබූ අයදුම්කරු පත්වීම භාර ගත් පසුවද රාජකාරියට වාර්තා කළේ නැත. මෙබඳු විශාල ව්‍යාපෘතියක් හසුරුවනු පිණිස සියලු අංශ පිළිබඳ පළපුරුද්ද හා අත්දැකීම් සහිත ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයකු සිටීම ඉතා වැදගත්ය. ඒ අනුව, ව්‍යාපෘතියේ මෙහෙයුම් කළමනාකාර තනතුරේ රාජකාරි ඉටු කරන නිලධාරියා කොන්ත්‍රාත් පදනමින් නොව, අනුයුක්ත පදනමින් බඳවා ගනු ලැබීය. |
| **ii.** 2008 ජූලි 30 දින 2006/21 චක්‍රලේඛය | 2005, 2006 හා 2007 වර්ෂ තුළ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලදුව, තවමත් විශ්වවිද්‍යාලය තුළ සේවයේ යෙදී සිටින මෙහෙයුම් සහකාරවරුන් 17 දෙනකුගේ සේවය තවමත් ස්ථිර කිරීමට කටයුතු කර නොමැත. | මෙම සේවාවන් අනුමත සේවක මණ්ඩලය යටතේ ලබා ගන්නා සේවාවන් නොවන බැවින්, මෙම සේවකයින් ස්ථිර සේවක මණ්ඩලයට අන්තර්ග්‍රහණය කළ නොහැකිය. |
| (ඌ) මුදල් රෙගුලාසි | | |
| **(i)** 104 | අහිමි වූ වත්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත. | බහුමාධ්‍ය ප්‍රක්ෂේපකයක් (මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර්) අස්ථානගත වීම පිළිබඳව බදුල්ල පොලිසිය වෙත පැමිණිල්ලක් කර ඇති අතර, අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කෙරෙමින් පවතී. අභ්‍යන්තර පරීක්ෂණය අවසන් වූ පසුව මුදල් රෙගුලාසිවලට අනුව අවශ්‍ය සීරු මාරු කිරීම් සිදු කෙරෙනු ඇත. |

| | | | |
|---|---|---|---|
| **(ii)** 110 | | හානි සහ අලාභ වාර්තාගත කරනු පිණිස ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | හානි සහ අලාභ ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කෙරෙනු ඇත. |
| **(iii)** 756 | | පුස්තකාල ග්‍රන්ථ සහ ඉතිරි ඖෂධ තොග පිළිබඳව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කොට නොමැත. | ලබන වර්ෂයේ සිට පුස්තකාල ග්‍රන්ථ සහ ඉතිරි ඖෂධ තොග පිළිබඳව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කෙරෙනු ඇත. |

3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, පෙර වර්ෂයේ රජයේ ප්‍රතිපාදන වශයෙන් පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රුපියල් 108,870,000 ක මුදල ද ගිණුම්ගත කළ පසුව ලබා තිබූ රුපියල් 10,441,719 ක ඌණතාවට සාපේක්ෂව, මෙම විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කටයුතුවලින් රජයේ ප්‍රතිපාදන වශයෙන් පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රුපියල් 152,800,000 ක මුදල ද ගිණුම්ගත කළ පසුව රුපියල් 2,450,399 ක අතිරික්තයක් අත් වී තිබේ. ඒ අනුව, එම මූල්‍ය ප්‍රතිඵලයෙහි දැක්වුණු රුපියල් 12,892,118 ක දියුණුව ප්‍රධාන වශයෙන් පුනරාවර්තන ප්‍රතිපාදනයන්හි, ස්වයං මූල්‍ය සම්පාදන වැඩසටහනේ ආදායම හා වෙනත් ආදායම් හේතුවෙන් විය.

පෙර වර්ෂයට සාපේක්ෂව මූල්‍ය වර්ධනය අත් වූයේ මහා භාණ්ඩාගාරය වෙතින් නිසි කලට පුනරාවර්තන වියදම් ලැබීම, ඇස්තමේන්තුගත කළ පරිදි මුදල් වැය කිරීම සමීප ලෙස අධීක්ෂණය කිරීම, සහ ආයතනයේ ඉපැයීම් වැඩි වීම හේතුවෙනි.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 අධ්‍යාපනික කාර්යසාධනය

(අ) 2009 වර්ෂය සමග සන්සන්දනය කරන කල, 2010 වර්ෂය තුළ බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 45 දෙනකුගෙන්, එනම් 8.5 % කින් අඩු වී තිබුණි.

පෙර වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එවන ලද ශිෂ්‍ය සංඛ්‍යාව අඩු කර ඇත. 2010 වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යාව පහළ යාමට මුල් වූ හේතුව එය විය.

(ආ) 2006 සිට 2010 දක්වා වූ වර්ෂ තුළ ලියාපදිංචි ශිෂ්‍ය ශිෂ්‍යාවන් 68 දෙනෙක් විශ්වවිද්‍යාලයේ සිය පාඨමාලා අත් හැර ගොස් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පැවැත්වුණු අවසන් වර්ෂ පරීක්ෂණයට පෙනී සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් 151 දෙනකු අතරින් 148 දෙනෙක් සමත් වූ අතර තිදෙනෙක් යළි පරීක්ෂණයට පෙනී සිටීමට යොමු කරන ලදි.

අප මෙය පරීක්ෂා කර බැලූ අතර, ශිෂ්‍ය ශිෂ්‍යාවන් පෞද්ගලික හේතු නිසා පාඨමාලා හැර ගොස් තිබුණු බව නිරීක්ෂණය විය.

අපි මෙය පිළිගනිමු.

3.2.2 එක් ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක සඳහා පිරිවැය

| වර්ෂය | ශිෂ්‍යයකුට සාමාන්‍ය අගය (පුනරාවර්තන පිරිවැය රුපියල්) |
|---|---|
| 2006 | 235,226 |
| 2007 | 201,015 |
| 2008 | 160,101 |
| 2009 | 121,704 |
| 2010 | 117,128 |

එක් ශිෂ්‍යයකු /ශිෂ්‍යාවක සඳහා වූ වියදම අඩු වූයේ වියදම් නිසි ලෙස කළමනාකරණය කිරීම සහ ඇතුළත් කර ගත් ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ යාම හේතුවෙනි.

3.2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) පරිගණක පද්ධති

**i.** මෙම විශ්වවිද්‍යාලය සිය පොදු පරිපාලනය සඳහා භාවිතා කරනු පිණිස පරිගණක පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා 2006 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් සමග රුපියල් 3,680,000 ක් සඳහා වූ ගිවිසුමකට එළඹී අතර, එකඟ වූ මුදලෙන් %20ක් වූ රුපියල් 736,000 ක මුදලක් අත්තිකාරමක් වශයෙන් අදාළ සමාගමට ගෙවා තිබුණි .කෙසේ වුවද ගිවිසුම්කරු අවශ්‍ය පරිදි පරිගණක පද්ධතිය සපයා නොතිබූ අතර ,රුපියල් 368,000 ක කාර්යසාධන බැඳුම්කරය 2007 පෙබරවාරි 20 වන දින කල් ඉකුත් විය .ගිවිසුමට අනුව පරිගණක පද්ධතිය සපයා නොතිබීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට සිදු වූ පාඩුව අදාළ සමාගමෙන් අය කර ගනු පිණිස ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි .

ගෙවන ලද අත්තිකාරම් මුදල් ගිවිසුම්කරු ගෙවිය යුතුය යන කොන්දේසිය මත මෙම ගිවිසුම හමාර කර තිබේ. අදාළ මුදල අය කර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

| | |
|---|---|
| **ii.** 2004 සිට 2007 දක්වා වූ වර්ෂ 4 සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පරිගණක අධ්‍යයන කටයුතු සඳහා පරිගණක 110 ක් කුළී පදනම මත ලබා ගනු පිණිස පෞද්ගලික සමාගමකට රුපියල් 22,870,727ක මුදලක් ගෙවා තිබුණි. වෙළඳපලේ පරිගණක මිළගණන් සලකා බලන කළ , පසු ගිය වර්ෂ 4 සඳහා පරිගණක කුළියට ගැනීමට ගෙවන ලද මුදලින් නවීන පන්නයේ පරිගණක 280 ක් මිළට ගත හැකිව තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය කරන ලදි. | ආයතනික සැලැස්මේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ප්‍රධාන කටයුතු නොවන සියලුම ක්‍රියාකාරකම් බාහිර සේවා සම්පාදකයින් වෙතින් ලබා ගැනීමට පියවර ගෙන තිබුණි. ස්ථිර වත්කම් වශයෙන් පරිගණක ලබා ගනු වෙනුවට, පරිගණක විද්‍යාගාරය සඳහා අවශ්‍ය පරිගණක නිසි ප්‍රසම්පාදන කාර්යපටිපාටි අනුගමනය කරමින් බාහිර සේවා සම්පාදකයකු වෙතින් ලබා ගන්නා ලද්දේ පහත කාරණා හේතුවෙනි.<br><br>- මෙම භාණ්ඩ මිළට ගැනීම සඳහා මූලික ආයෝජනයක් අවශ්‍ය නොවීම.<br>- තාක්ෂණිකව ඇති වන වෙනස්කම්වලට යටත්ව සේවාව ලබා ගැනීමට හැකි වීම.<br>- වාර්ෂිකව විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාව මත පදනම්ව පරිගණක මාරු කිරීමට හැකි වීම.<br>- ස්ථිර වත්කම් නඩත්තු කිරීම සඳහා වියදමක් ඇති නොවීම.<br>- පරිගණකයක් දෝෂ සහගත වූ විට නව පරිගණකයක් ලබා ගැනීමට හෝ දෝෂ නිවැරදි කරවා ගැනීමට හැකි වීම.<br>- පරිපාලන සහ සේවක ගැටළු අවම කර ගත හැකි වීම. |
| (ආ) නිවාස පහසුකම් | |
| **i.** විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩල සාමාජිකයින් 59 දෙනකු සඳහා නිවාස පහසුකම් ලබා දීම සඳහා මාසික කුළී පදනමින් නිවාස 38 ක් බදු ගෙන තිබූ අතර 2010 ,වර්ෂයේදී නිවාස හිමිකරුවන්ට කුළිය වශයෙන් රුපියල් 3,654,496 ක මුදලක් ගෙවා තිබුණි . කෙසේ වුවද , කාර්යමණ්ඩලයෙන් කුළිය වශයෙන් අය කර ගෙන තිබුණේ රුපියල් 521,762 ක් පමණි .ඒ අනුව විශ්වවිද්‍යාලයට නිවැසියන් සඳහා කුළී වියදම පියවනු පිණිස රුපියල් 3,132,734 ක අතිරික්ත වියදමක් දැරීමට සිදු වී තිබේ. | විශ්වවිද්‍යාලය සතුව නිල නිවාස නොමැති නිසා එම පහසුකම කාර්යමණ්ඩලයට ලබා දෙනු පිණිස මෙම විශ්වවිද්‍යාලය නිවාස කුළියට ගෙන ඇත. විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයට අනෙක් රජයේ සේවකයින්ට වඩා වැඩි පැය ගණනක් ශිෂ්‍ය කටයුතුවල නිමග්න වීමට සිදු වේ. විශ්වවිද්‍යාලයට අදාළ වියදම මුළුමනින් ම කාර්යමණ්ඩලයෙන් අය කිරීම කළ නොහැක. |
| **ii.** අවිවාහක නිවස්න සඳහා මෙම විශ්වවිද්‍යාලය කුළියට අතිරේකව මාසික විදුලි බිල්පත් හා ජල බිල්පත් ද ගෙවා තිබූ නමුත් ,එහි නවාතැන් ගෙන සිටින කාර්යමණ්ඩල සාමාජිකයින්ගෙන් | අවිවාහක කාර්යමණ්ඩල සාමාජිකයින් බහුතරයකට උප නේවාසිකාගාර පාලක රාජකාරි හා වෙනත් පරිපාලන කාර්යන් පවරා ඇති නමුදු, විශ්වවිද්‍යාලය ඒ සඳහා ඔවුන්ට අමතර ගෙවීමක් නොකරන බැවින්, |

| | |
|---|---|
| කිසිදු මුදලක් අය කර ගෙන නොතිබුණි. | නේවාසිකාගාර සහ නිල නිවාස තුළ සිටින අවිවාහක කාර්යමණ්ඩල සාමාජිකයින් ගෙන් කුළිය වශයෙන් මෙම විශ්වවිද්‍යාලය කිසිදු මුදලක් අය කර නොමැත. |
| 3.2. 4 වත්කම් කළමනාකරණය | |
| (අ) අවශ්‍යතාවන් පිළිබඳව සලකා බැලීමකින් තොරව 2006, 2007 හා 2009 වර්ෂ සඳහා ශිෂ්‍ය අත්පොත් මුද්‍රණය කිරීම හේතුවෙන්, රුපියල් 172,825 ක පිරිවැයකින් යුතු ශිෂ්‍ය අත්පොත් 557 ක් කිසිදු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව පැවතුණි. | පෙර වර්ෂවල ඉලක්කගත ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව නොලැබුණු හෙයින් අදාළ මුද්‍රිත ශිෂ්‍ය අත්පොත් භාවිතයට නොගෙන පැවතුණි. |
| (ආ) 2010 ජුනි 29 වන දිනැති අභ්‍යන්තර විගණන වාර්තාව අනුව රුපියල් 76, 422 ක් වටිණා පුස්තකාල ග්‍රන්ථ 145 ක් අස්ථානගත වී තිබුණි. | අස්ථානගත වූ පුස්තකාල ග්‍රන්ථ පිළිබඳව බදුල්ල පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, අභ්‍යන්තර විමර්ශන සිදු කෙරෙමින් පවතී. |
| (ඇ) ඖෂධ වර්ග 29 ක තොගයක කාලය ඉකුත් වී තිබුණි. | කල් ඉකුත් වූ ඖෂධ බැහැර කරනු පිණිස කටයුතු කෙරෙනු ඇත. |
| (ඈ) මිලට ගෙන ඇති අතිරික්ත ඇඳන් 76 ක් සහ මෙට්ට 198 ක් 2010 දෙසැම්බර් 31 දින වන විට ගබඩාව තුළ සහ “එෆ්” ගොඩනැගිල්ලේ තබා තිබුණි. | මෙම භාණ්ඩ අවශ්‍ය වූ විට බාහිර නේවාසිකාගාරවල නවාතැන් පහසුකම් සඳහා භාවිතා කරනු ලැබේ. |
| (ඉ) 2010 ජුනි 30 වන දින මිළට ගනු ලැබූ රුපියල් 322,560 ක් වටිණා ගින්නට ඔරොත්තු දෙන සේප්පු 5 ක් 2011 මැයි මස 31 වන දින දක්වාම භාවිතයට ගෙන නොතිබුණි. | ගින්නට ඔරොත්තු දෙන සේප්පු භාවිතයට ගැනීමට කටයුතු කෙරෙනු ඇත. |
| 3.2.5 මානව සම්පත් කළමනාකරණය | |
| (අ) මෙම විශ්වවිද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යා අනුව, අධ්‍යයන කාර්යමණ්ඩලයේ මහාචාර්ය තනතුරු 7 ක් සහ 1 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 3 ක් සඳහා පැවති පුරප්පාඩු 2006 සිට 2011 අගෝස්තු මාසය දක්වාම පුරවා නොතිබුණි. 2011 දෙසැම්බර් 31 වන දින වන විට අධ්‍යයන කාර්යමණ්ඩලයේ තනතුරු 129 න් තනතුරු 32 ක් ම පුරප්පාඩුව පැවතුණි. | **අධ්‍යයන පුරප්පාඩු**<br><br>අධ්‍යයන පුරප්පාඩු පිරවීම සඳහා දැන්වීම් පළ කරන ලද අතර, අපි 2011 වර්ෂය අවසාන වන විට අධ්‍යයන පුරප්පාඩු පුරවා අවසන් කිරීමට කටයුතු කරමින් සිටිමු. |
| (ආ) අනුමත අනධ්‍යයන කාර්යමණ්ඩල තනතුරු 82 න් 58 ක්ම පුරප්පාඩුව පැවතුණි. | **අනධ්‍යයන පුරප්පාඩු**<br><br>දැනටමත් අපි තාක්ෂණික නිලධාරින් දෙදෙනකුගේ, ගබඩා භාරකරුගේ හා |

| | |
|---|---|
| | ෂ්රොෆ්වරයාගේ පුරප්පාඩු පුරවා ඇත්තෙමු. දැනට ලිපිකාර සේවාවන් ඉටු කරනු ලබන්නේ අනුයුක්ත පදනමින් සිටින මෙහෙයුම් සහකාරවරුන් විසිනි. අනුමත සේවක සංඛ්‍යා අනුව ස්ථිර පදනමින් තනතුරු පුරප්පාඩු පුරවනු පිණිස දැනටමත් කටයුතු ආරම්භ කර ඇත. |
| (ඇ) 2006 නොවැම්බර් 04 වන දින සිට 2011 අගෝස්තු 04 වන දින දක්වා කාලය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය නොමැතිව වැඩබලන පාඨමාලා අධ්‍යක්ෂවරයකු පත් කොට, දින 37 ක් පමණක් වූ සේවය සඳහා රුපියල් 378,000 ක් දීමනාවක් සහ රුපියල් 154, 419 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. | කළමනාකරණ පීඨයේ ජොෂ්ඨ කථිකාචාර්ය තනතුරේ පුරප්පාඩුව සඳහා කීප වරක්ම අයදුම් පත්‍ර කැඳවන ලදී. උචිත සුදුසුකම් සහිත තැනැත්තන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු බැවින්, විශ්වවිද්‍යාලයට මෙම මහාචාර්යවරයාගේ සේවය ලබා ගැනීමට සිදු විය. වැඩබලන පාඨමාලා අධ්‍යක්ෂවරයකු නිසි වගකීමෙන් යුතුව පහත සඳහන් වගකීම් කාර්යක්ෂම ලෙස ඉටු කරයි.<br><br>- කළමනාකරණ උපාධි වැඩසටහන්වල පාඨමාලා සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම.<br>- පාඨමාලා ක්‍රියාකාරකම්වලදී අභ්‍යාසලාභී කථිකාචාර්යවරුන්ට මග පෙන්වීම ,ඔවුන් මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම.<br>- ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කර්මාන්ත පුහුණුව ලබා දීම ආශ්‍රිතව , ඇගැයීම සඳහා මූලික ලියැවිලි පිළියෙළ කිරීම සහ එම කටයුතු මෙහෙයවීම.<br>- පාඨමාලා කමිටු රැස්වීම් පැවැත්වීම සහ ව්‍යවසායකත්ව හා කළමනාකරණ උපාධි වැඩසටහන් සම්බන්ධයෙන් නායකත්වය ලබා දීම.<br>- ව්‍යවසායකත්ව හා කළමනාකරණ උපාධි වැඩසටහන් සම්බන්ධයෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මුහුණ දෙන ගැටළු විසඳීම.<br>- ව්‍යවසායකත්ව හා කළමනාකරණ උපාධි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පර්යේෂණ ව්‍යාපෘති වාර්තා අධීක්ෂණය කිරීම.<br><br>මෙම උපාධි වැඩසටහන සඳහා ජොෂ්ඨ කථිකාචාර්යවරයකු බඳවා ගත් වහාම මෙම මහාචාර්යතුමාගේ සේවය නැවැත්වීමට කටයුතු කෙරෙනු ඇත. |

### 3.2.6 අයවැය පාලනය

| | |
|---|---|
| ප්‍රතිශෝධිත අයවැය සහ තථ්‍ය අයවැය අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර, සඵලදායී කළමනාකරණ පාලන මෙවලමක් ලෙස අයවැය යොදා ගෙන නොමැති බව එමගින් පැහැදිලි වේ. | අප විසින් සඵලදායී ලෙස වියදම් පාලනය කර ගෙන ඇති බැවින් එමගින් යහපත් විචලනයන් අත් වී තිබේ. බැහැර පැවරූ සේවාවන් සහ ගිවිසුම්ගත වියදම් අපි මැනවින් අධීක්ෂණය කළෙමු. කෙසේ වුවද, විශ්වවිද්‍යාලය දැනට සංවර්ධන අවධියෙහි පවතින බැවින්, නිරවද්‍ය ලෙස ආදායම් සහ වියදම් පුරෝකථනය කිරීම දුෂ්කරය.<br><br>බාහිර ආයතනවලින් ලද ඉල්ලීම් අනුව, විශේෂ වැඩසටහන් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීමෙන් ඉපැයීම් සිදු කර ඇත. කෙසේ වුවද, ප්‍රායෝගික ගැටළු හේතුවෙන් මෙම ඉපැයීම් අදාළ වර්ෂයේදීම ගිණුම්ගත කළ නොහැකි විය. එම හේතුවෙන් යහපත් විචලනයක් ඇති වී තිබේ.<br><br>අවසාන කාර්තුව තුළ අයහපත් විචලනයක් පිළිබිඹු කර ඇත්තේ විදුලිය, ආරක්ෂාව, විදුලි සංදේශ සහ පවිත්‍රතා සේවාවන් සඳහා වූ වියදම් වැඩි වීම හේතුවෙනි. |